سنهالي

රමඩාන් මාසයේ උපරිම ඵල නෙලා ගැනීමට නම්...

نفحات من رمضان



සාජහාන් අබ්දුල් කාදර්

ඉස්ලාම් හඳුන්වාදීමේ කමිටුවේ ප්‍රකාශනයකි!

لجنة التعريف بالإسلام
Islam Presentation Committee

IPC
دار التعريف بالإسلام
Islam Presentation Committee

نفحات من رمضان

اللغة السنهالية

රමඩාන් මාසයේ උපරිම ඵල නෙලා ගැනීමට නම්...

تأليف

الشيخ / ساجاهان عبد القادر

සාජහාන් අබ්දුල් කාදර්
NALEEMI, B.A. (CEY)

ඉස්ලාම් හදුන්වාදීමේ කමිටුවේ ප්‍රකාශනයකි

අල්ලාහු අතිශ්‍රේෂ්ඨයැයි කීකර්තනය කිරීම පිණිසද, තොප කෘතඥවනු පිණිසද, අල්ලාහු තොපට පහසු කිරීම සිතන්නේය. අපහසු කිරීම නොසිතන්නේය. (අල්කුර්ආන්:2:185) රමධාන් මාසයේ සවිමයේ යෙදීමට හේතුව අල්කුර්ආනය පහළවීමයි, යනු එයින් ඉතා හොඳින් පැහැදිලිවේ.අල්කුර්ආනය මනුෂ්‍ය වර්ගයාට ඉතා හොඳ මගපෙන්වීමකි මග පෙන්වීමක් පමණක් නොව නිවැරදි මාර්ගය දක්වන පැහැදිලි ඉගැන්වීම්වලින් යුක්ත සත්‍ය හා අසත්‍ය තෝරාගැනීමේ මිනුම් දණ්ඩක්ද වේ. එය මිනිස් සමාජයට ලැබූ උතුම් දායාදයකි. එම දායාදය ලැබූ දිනය මුළු මිනිස් සමාජයම ප්‍රීතියෙන් හා උත්සවකාරයෙන් භුක්තිවිඳ ගතයුතුයි, යන්නෙහි කිසිදු වෙනත් අදහසක් නොමැත.තවද මෙම මහගු දායාදය සිහිපත් කිරීම මිනිසාගේ පරම යුතුකමක් සේ සැළකේ. එනම් වැරදි (දුර්මාර්ගයෙහි) මාර්ගවල නියැළී පීවත්වූ මිනිසාව නියම යහපත් මාර්ගයට අල්කුර්ආනය මගින් යොමු කලේය. එමනිසා අල්කුර්ආනය පහලවූ අවස්ථාව උත්සවාකාරව භුක්තිවිඳ එයට ස්තුතිය සහ භක්ති ප්‍රණාමය පුදකල යුතුය.

කෙසේ එය උත්සවාකාරව භුක්තිවිඳින්නේද? කෙසේ අල්ලාහ්ට ස්තුතිය පුද කරන්නේද, යන්න විස්තර කරනවිටදී අල්කුර්ආනය සවිමයේ යෙදෙන්නයැයි පවසයි. සවිමයේ යෙදී අල්කුර්ආනය පහළවූ අවස්ථාව සතුටින් භුක්තිවිඳ දෙවියන්ට ස්තුතිය හා භක්තිය පුද කිරීමට හේතුව ඇයිදැයි මෙයින් පැහැදිලි විය යුතුය. එය අපගේ දැනගැනීම සඳහා අල්කුර්ආනය පහළවූ හේතූන් විස්තර කිරීමේදී එය මෙසේ එහි සඳහන්වේ. "ඔබතුල ශ්‍රද්ධාවන්ත භාවය වර්ධනය විය හැකිය " යනුවෙන් පැවසීම ඉතා ගැඹුරින් කල්පනා කළ යුතුය. ශ්‍රද්ධාවන්තභාවය යනු අල්ලාහ් කෙරෙහි බිය විය යුතුය, අයහපත් ක්‍රියාවන් තමා තුලින් සිදු නොවිය යුතුය, යන්න අවධාරණයවේ. ලෝකෝත්තර වූ ඉතා දීර්ඝ උත්සාහයක් දරා සිත පාලනය කිරීමේ ශක්තිය ඇතිකර ගැනීම දේව භක්තිය ඇති කරගැනීමට මාර්ගයවේ. තොපෙන් කියමන සැගවූ අය හෝ එය එළිදරව් කල අයද රාත්‍රී සැගවුනු අය හෝ දවල නිදැල්ලේ හැසුරුනු අයද (ඔහුට) එක සමානයහ. (අල්කුර්ආන් 13:10) මෙම අල්කුර්ආන් පාඨය තනි පුද්ගලයෙක් පමණක් නොව සමාජයක් යහ මගෙහි ගමන් කිරීමට ආධ්‍යාත්මික හේතූන් අවශ්‍ය බව පෙන්නුම් කරයි.

තනි පුද්ගලයෙක් වුවත් සමාජයක් වුවත් එය ජය ලබාගැනීමට නම් මනස පුහුණු කිරීම අවශ්‍ය බව මෙම වාක්‍ය මඟින් පැහැදිලි වේ.

දේව භක්තිය හා යහපත් ගතිගුණාංග ඇති කිරීමේ අරමුණින් අල්ලාහ් දෙවියන් සෑම දේව නැමදුමක්ම අනිවාර්ය කර තිබේ. නමුත් සවිමය තුල සෑම දේව නැමදුමක්ම එක්රැස් කර තබා ඇති බව පෙනේ. වෙනත් කාලයන්හිදි අනිවාර්ය නොවූ අවශ්‍ය කරුණක් වන තහජ්ජුද් හෙවත් මැදියම් රාත්‍රී කාලයේ ඉටුකරන සලාතය මෙම රමධාන් මාසයෙහි සෑම මුස්ලිම්වරයෙක්ම අනිවාර්ය කරගෙන කාල වේලා ඇතුව එහි නිරතවීම දැනගත හැක. මෙය තරාවීහ් සලාතය යන නමින් හැඳින්වේ. ඉ:තිකාෆ් හෙවත් පල්ලියේ රැඳී සිටීම අනිවාර්ය නොවූ කරුණකි. නමුත් රමධාන් මාසයේ වැදගත් රැයක්වන ලෙයිලතුල් කද්ර් රැය ලබාගැනීමේ සිතින් අවසාන දින දහය මෙය අනිවාර්යයෙන් පිළිපදිනු ලැබේ. ඉහ්තිකාෆ් යනු සමාජයේ සියළු ක්‍රියාවලින් බැහැරවී මුළුමනින්ම තනිවී සලාතය කිරීම, අල්ලාහ් සිහිපත් කිරීම(දික්ර්) අල්කුර්ආනය පාරායනය කිරීම, වැනි ආගමික කරුණුවල සම්පූර්ණයෙන්ම නිරතවීම වේ. ඔවුන් එයින් සුපිරිසිදු කරනු පිණිසත්, ඔවුන් (ගේ යහකම්) දියුණු කරනු පිණිසත්, ඔවුන්ගේ වස්තුවෙන් සදකාවක් ගනුව, ඔවුන් උදෙසා දුආ කරව, ඇත්තෙන්ම මුඔගේ දුආ කිරීම ඔවුනට ශාන්තියකි, අල්ලාහු අසන්නේය, දන්නේය. (අල්කුර්ආනය 9:103) මිනිස් සිත් ලෞකික ආශාවලින් මුදවා ගන්නා ක්‍රියාකාරී පුහුණුවක් සේ සකාත් නම් දුගී බද්ධ සඳහන්වේ. සවිමයේ යෙදුනු කාලයන්හි අවසන් වක්තෘවරයාණන් වන මුහම්මද් (සල්) තුමාණන් හමායන සුළඟට වඩා වැඩි වැඩියෙන් දන්දීමේ නිරතවූ බව සඳහන්වේ. (මුලාශ්‍රය-බුහාරි ග්‍රන්ථය) සාමාන්‍යයෙන් සෑම කෙනෙකුම දන්දීමෙහි නිරතවීම තමාගේ පුරුද්දක් වශයෙන් රැක ගැනීමට අවශ්‍යවේ. සකාතුල් පිත්ර් දන්දීමේ ක්‍රමය පිලිපැදිය යුතුයි, යනුවෙන් ඉස්ලාමය සඳහන් කරයි.

මෙම ආකාරයට සවිමය හෙවත් උපවාසය ආධ්‍යාත්මික පුහුණුවක් ලබාදෙන මාසයක් සේ සැළකේ. සිත්තුල දේව භක්තියක් ඇති කිරීමට මෙම සවිමය ඉවහල්වනවාට කිසිම සැකයක් නැත. අල්කුර්ආනය මුළු මානව සංහතියටම යහමග පෙන්වීම සඳහා පහළවූ

බව සත්‍යවුවත් එම මගපෙන්වීමෙන් ප්‍රයෝජන ගැනීමටනම් දේව භක්තිය නම් හැඟීම ඉතා අවශ්‍යවේ. මෙය "අල්කුර්ආනය දේව භක්තිය තිබෙන අයට යහමග පෙන්වයි, "ඒ විදුලිය ඔවුන්ගේ දෘෂ්ඨාලෝකය පැහැර ගැනීමක් මෙන් විය. විදුලිය කොටත්ම ඔවුහු එහි ඇවිදිති, ඇඳිරි වැටෙත්ම ඔවුහු නිසල වෙති, අල්ලාහු කැමතිනම් ඔවුන්ගේ ශ්‍රවණයද ඔවුන්ගේ දෘෂ්ඨියද පහ කෙරෙයි. ඇත්තෙන්ම අල්ලාහු සියළු දැය කෙරෙහි බලසම්පන්නය" (2:20) යනුවෙන් අල්කුර්ආනයේ සඳහන් වේ. එමනිසා අල්කුර්ආනය පහළවූ මාසයේ මෙම අල්කුර්ආනයෙන් ප්‍රයෝජන ගැනීම සඳහාවූ උත්සාහයේ නිරතවීම ඉතා ගැළපේ. දේව මගපෙන්වීම පහළවූ මාසය නිසා එම මගපෙන්වීමෙන් ප්‍රයෝජන ලබාගැනීම සඳහා සවිමයේ යෙදී අධ්‍යාත්මිකව තමා සකස්කර ගතයුතුයැයි යනුවෙන් මිනිසාට අණකරන ලදී

රමධාන්හි ඉගැන්වීම්

අල්ලාහ්තආලාගේ අසීමිත කරුණාව හේතුකොටගෙන ඔහු මුස්ලිම්වරුන්ට සවිමය (උපවාසය) අනිවාර්ය කර එමගින් තමාට යටත්වන තමාගේම දූසයන්ගේ පව් ක්ෂමා කරනවාත් සමග ඔවුන්ට එම සවිමයෙන් උසස් තත්ත්වයක්ද ලබාදෙයි. සවිමය ඉස්ලාමයේ කුළුණුවලින් එකක් වන අතර පිරිසිදු හදවතින් සවිමයෙහි යෙදෙන අයවලුන්ට දේව භක්තිය පිරි අයසේද පරිවර්තනය කරන ක්‍රියාමාර්ගික පාඩමක්සේද සැළකේ. සවිමය දූසයින්ගේ චින්තනය යහමගට යවා ඔහුගේ ආත්මයට අභ්‍යාස ලබා දෙනවාත් සමග ඔහු ඉවසීමෙන් දේව නැමදුම්වල යෙදී සිටීමටද තමාගේ ජීවිතයේ ඇතිවන ප්‍රශ්නයන් ඉවසාගැනීමටද ඔහුට දිරිය ලබාදෙයි. සවිමය මුස්ලිම් සමාජයේ නොයෙක් ඵලප්‍රයෝජනයන්ද ලබාදෙන කරුණාකි. මෙම සවිමය සමාජයේ පවත්නා දුප්පත් පොහොසත් භේදය තුරන්කර ඔවුන් අතරේ සමානතාවයක් ඇති කිරීමටද උපකාරවේ. දුගියා සහ පොහොසතා එක වේලේ කුසගින්නේ සිටීමට පෙළඹවීමෙන් පොහොසතා දුගියාගේ කුසගින්න දැනගනී. මෙයින් ඔවුන් අතරේ ආදරය කරුණාව ඇතිවීමටද, දෙවියන් ඔවුන්ට අනිවාර්ය කල සකාත් නම් දුගී බද්ද (දන්) ගෙවීම අවශ්‍යයි යන හැඟීම ඇතිවීමටද, පෙළඹේ තවද සවිමය

මිනිසාගේ කැළල්වූ සිත් පිරිසිදු කර ආඩම්බරය වංචාව වැනි දුර්ගුණාංගවලින් පිරිසිදු කරයි. තවද එය අපගේ සමාජ ජීවිතය යහපත් කර සමාජයේ සාමය සමාදානය හා එක්සත්කම ඇතිවීමට මගපාදයි. සවිමයේ යේදීමෙන් මුස්ලිමෙක් සත්‍ය නැමදුම්කරුවෙක් බවට පත්වෙයි. එනම් සවිමය මිනිස් සිත් සමග ඔහුගේ ගෞරවය අවංකකම විශ්වාසය සමගද එකට බැඳුණ ක්‍රියාවක්සේ සඳහන් වේ. සවිමයේ යෙදෙන්නාගේ සත්‍යතාවය අල්ලාහ් හැර කිසිවෙක් නොදනී. සවිමය ආධ්‍යාත්මිකව සහ සමාජීය වශයෙන් පමණක් නොව ශරීර සෞඛ්‍ය සම්පන්න ජීවිතයකටද මග පෙන්වයි. මිනිසා ආහාරයට ගන්නා කෑම්බීම් ආදිය ඔහුගේ බහුතර ලෙඩරෝගයන්ට හේතුවේ. ක්‍රමානුකූලව ආහාර ගැනීම මෙවැනි ලෙඩ රෝගයන්ගෙන් ඔහුව ආරක්ෂා කරයි. මෙසේ සවිමය ශරීර සෞඛ්‍යයට හා ශක්තියට උපකාර වන බව දැනගත හැක.

සවිමය ගැන මුහම්මද් නුමාගේ වදන්

1- අල්ලාහ් දෙවියන් පැවසූ බවට වක්තෘ මුහම්මද්නුමාණන් මෙසේ වදාළහ. "උපවාසය හැර මිනිසාගේ සෑම යහපත් ක්‍රියාවක්ම ඔහු සතුය, උපවාසය මා වෙනුවෙන්මය, මවිසින්ම පරිදානයද කරනු ලබන්නේය.

2- උපවාසය අයහපත් ක්‍රියාවන්ගෙන් විශ්වාසවන්තයින්ව ආරක්ෂා කරන පළිහකි. එබැවින් ඔබ අසභ්‍ය වචනයෙන් හා දුරාචාර හැසිරීමෙන් වැළකීසිටින්න, තවද ශබ්ද නගා කතා නොකරන්න, යමෙක් උපවාසිකයෙකු හට බැන වදින්නේ හෝ දබර කරන්නේ නම් "අහෝ සොයුර මම උපවාසිකයෙක්මි" දෙවරක් පවසන්න. කාගේ අත්වල මුහම්මද්ගේ ආත්මය තිබේද, ඔහුමත දිවිරා කියමි. විනිශ්චය දිනයේදී උපවාසිකයාගේ මුවෙහි සුගන්ධය අල්ලාහ් හට කස්තුරි සුවඳටත් වඩා ප්‍රිය ජනක වන්නේය.උපවාසය රකින්නා හට සන්තෝෂ දෙකකි. එකක් උපවාසය අවසන් කරන අවස්ථාවේය, දෙවැන්න ඔහුගේ දෙවියන්ව විනිශ්චය දිනයේදී හමුවනවිට තමාගේ උපවාසය සිහිකරනවිටදීය. (අහමද් මුස්ලිම් අන්නසාඉ) මාගේ නාමයෙන් ඔහු ආශාවන්ගෙන් ආහාරයන්ගෙන් හා පානයන්ගෙන් වැළකී සිටියහ. උපවාසය මා

වෙනුවෙන්මය, මා විසින් පරිදනයද කරනු ලබන්නේය, පුද්ගලයෙකුගේ සෑම යහපත් ක්‍රියාවකටම පරිදනය දහවරක් සිට වැඩිකරනු ඇත්තේය. (බුහාරි අබුදවුත්)

3- සවිමය හා අල්කුර්ආනය විනිශ්චය දිනයේදී දැසයන් වෙනුවෙන් මැදිහත්ව කථාකරයි. දෙවියනි දවල්කාලයේ ආහාරයන් හා ආශාවන් මා වැළකුවෙමි, එමනිසා ඔහු වෙනුවෙන් මා හට මැදහත්ව කථා කිරීමට අවසර දෙන්නයි සවිමය කියයි. රාත්‍රියෙහි මා ඔහුගේ නින්දෙන් ඔහුව වැළැක්වුවෙමි, එමනිසා ඔහු වෙනුවෙන් මා හට මැදහත්ව කතා කිරීමට අවසර දෙන්නයි අල්කුර්ආනය පවසයි. පසුව ඒ දේවල් ඔහු වෙනුවෙන් මැදහත්ව කතාකරයි. (අහමද්)

4- අබු උමාමා මෙසේ පැවසූහ. මා දේව වක්තෘවරයාණන් වෙතට පැමිණ මා ස්වර්ගයේ ඇතුල්කරන ක්‍රියාවක් ගැන කියා දෙන්නැයි පැවසුවෙමි, එවිට ඔහු ඔබ සවිමයේ යෙදෙන්න, වෙන කිසිවක් නොමැතයැයි පැවසූහ. යළිත් වතාවක් ඔහු දෙසට පැමිණි විට ඔබ සවිමයේ යෙදෙන්නැයි පැවසූහ. (අහමද් නසායි අල්හාකිම්)

5- වක්තෘවරයාණන් පැවසූ බව අබු සර්ද් අල්කුද්රි ප්‍රකාශ කරයි. "දෙවියන්ගේ මාර්ගයෙහි යමෙක් දවසක් සවිමයේ යෙදුනානම් එයට ඔහුගේ මුහුණේ සිට හරිප හැත්තෑවක් නිරය ඈත් කරයි (හරිප යනු වසරක දුරයි)

6- ස්වර්ගයේ රයියාන් නම් දොරටුවක් ඇත. විනිශ්චය දිනයේ සවිමයේ නිරතවූවන් කොහේදැයි එතැන් සිට විමසන ලදී. අවසන් සවිමයේ උපවාසවන්තයා එතැනින් ඇතුල්වූ විගස එය වසනු ලැබේ. (බුහාරි මුස්ලිම්)

උපවාසයේ සම්පූර්ණ ඵලනෙලා ගැනීමට නම්,

උපවාසයේ වැදගත්භාවය සලකා, මුහම්මද් (සල්) තුමාණන් හට පෙර විසූ දේවවක්තෘවරුන්ගේ ජනසමාජ වලටද, අල්ලාහ් එය වගකීමක් ලෙස නියමකර තිබුණු බව පහත දැක්වෙන අල්කුර්ආන් වැකිය පැහැදිලි කරයි. විශ්වාසවන්තයිනි! නුඹලාට පෙර විසූ අයට

නියමකරන ලද්දාසේම, නුඹලාටද උපවාසය නියමකර ඇත්තෙහිය. මේ මගින්, නුඹ තුල ශුද්ධාවන්තභාවය වර්ධනය විය හැකිය. (අල්කුර්ආන්: 2:183)

සෑම ජනසමාජවලටම උපවාසය වගකීමක් බවට නියමකර තිබුණත්, අද මුස්ලිම්වරුන් යෙදෙන උපවාසයේ ආකාරයේම තිබුණේ යැයි කියා කීමට නොහැකිය. නවීන තාක්ෂණ යුගයේදී, විවිධ ජනසමාජයන්හි විවිධ ක්‍රමයන්හි උපවාසයේ යෙදීම දැකීමට පුළුවනි.

ඉස්ලාම් හඳුන්වා දෙන වගකීම් තුල ඉතා ගැඹුරු ලෙස අරමුණු ගැබිවී ඇත. එලෙසම, රමධාන් මාසයේ උපවාසයේ යෙදීම විවිධ අරමුණු මත වගකීමක් බවට නියම කර ඇත. එයින් කොටසක් අපි ඉතා කෙටියෙන් අධ්‍යයනය කරමු.

ශුද්ධාවන්තභාවය වර්ධනය කිරීමට මගක්

රමධාන් මාසයේ උපවාසයේ යෙදෙන කෙනෙකු ඉඳිරියේ රස බොජුන් තිබුණත් එය අනුභව නොකරයි. පිපාසයෙන් වෙහෙසවීමට පත්වුවත් ඉඳිරියේ ඇති සිසිල් පැන් පානය නොකරයි. රුමත් බිරිඳ ළඟ සිටියත් කාමයට වහල් නොවෙයි. අල්ලාහ් හැර වෙනත් කිසිවෙකු ඔහු දෙස බැල්ම හෙලන්නේ නැති අවස්ථාවේදී, තනිකමේ ඔහු සිටියත් ඔහු මෙවැනි සියළු දැයකින්ම ඈත්වී සිටියි. ඔහුගේ මෙම ක්‍රියාවට රුකුලක්වන්නේ අල්ලාහ් කෙරෙහි තිබෙන්නාවූ ශුද්ධාවන්තභාවයය. ඔහු දෛනිකව පැය ගණන් අඛණ්ඩව ශුද්ධාවන්තභාවය වර්ධනය කර ගැනීමට ලැබෙන මෙම ප්‍රායෝගික පුහුණුව මාසයක් පුරාම ලැබේ. එම නිසා, රමධාන් මාසයේ උපවාසය ශුද්ධාවන්තභාවය වර්ධනය කිරීම නිසැකය.

අල්ලාහ්ගේ ආශිර්වාද අගය කිරීමට මගක්

මිදුලේ පිපෙන පිච්චමලේ සුවඳ නොදැනේ යැයි කියමනක් ඇත. මෙම කියමන අල්ලාහ්ගේ ආශිර්වාදයටත් සමාන කළ හැකිය. කුමක්නිසාදයත්, මිනිසාගේ ජීවිතයට එය අඛණ්ඩව

ලැබෙන නිසා, මනුෂ්‍යා ඒ දැයෙහි අගය තේරුම් නොගන්නා අතර එයට ආවේනිකවූ ගෞරවය ලබා දීමටද, උනන්දු වන්නේ නැත. රමධාන් මාසයේ උපවාසයේ දී ආහාර හා පානයේ අත්‍යාවශ්‍යතාවය මනුෂ්‍යා වටහා ගනී. මෙය ඒ ආශිර්වාදයන් ලබා දුන් දෙවියන් කෙරෙහි, දයාව හදවතේ ගැඹුරට පතිත කරන අතර ඔහුට කෘතඥතාවය සමඟ ජීවත්වීමට මඟ පහදා දෙයි.

දුගී දුප්පතුන්ව දුප්පත්කමෙන් මුදවාහැරීමට මඟක්

කුසගින්න යන මාතෘකා යටතේ දේශනාවක් පැවැත්වීමෙන් හෝ රචනයක් ලිවීමෙන් කුසගින්නෙන් ඇතිවන වේදනාව ධනවතුන්ට වටහා දීමට නොහැකිය. ඔවුන්ද කුසගින්නේ ඉන්න ඉඩහැරීම කුසගින්නේ වේදනාව ඔවුන් වටහා ගැනීමට ඉතා සුදුසු මාර්ගයවේ.

දේවවක්තෘවරයෙකු වන යූසුෆ් තුමාණන්, ඊජිප්තුවෙහි භාණ්ඩාගාරය භාරව ක්‍රියා කරද්දී වැඩි වශයෙන් උපවාසයේ යෙදුනහ. මෙසේ කරන්න හේතුව කුමක්දැයි විමසූ කළ, මම මගේ කුස පිරෙන තුරු සැමදා ආහාර අනුභව කළොත් දුගීන්ගේ දුගීභාවය හා වේදනාව මා හට අමතක වී යාවි කියා බියවන්නෙමි යනුවෙන් පිළිතුරු දුන්නේය.

දවසකට පැය ගණන් කුසගින්නේ සිටින ධනවතා දුප්පත්කම වටහාගන්නේය. මාසයක් මුළුල්ලේ, තමා ඉවසීමෙන් දරාගෙන සිටි කුසගින්නේ පීඩාව හා වේදනාව දුප්පතුන් තමන්ගේ ජීවිත කාලයේදීම විඳිමින් සිටින බව ඔහු තේරුම් ගනී.

දුප්පත්කමෙන් ඔවුන්ව මුදවා හැරීම මෙම පීඩාවෙන් මොවුන්ව ආරාක්ෂා කිරීමට තිබෙන එකම මාර්ගය බව ඔහු වටහාගන්නේය එමනිසා දුප්පත්කම තුරන්කිරීමට තමාට කළ හැකි උපරිම කැපවීම කරන්නට ඔහු උත්සාහ වන්නේය ඉහත සඳහන් කරුණුවලින් දුප්පත්කම මිහිතලයෙන් තුරන් කළ යුතුයි යන හැඟීම උපවාසය තුළින් ලබාදෙන බව තේරුම් ගත හැකිය

ආත්ම දමනය කිරීම සඳහා මගක්

ලොවේ ඉතාම දුෂ්කර ක්‍රියාව මිනිසා තමාගේ ආත්මය දමනය කිරීමයි. ඔබගේ පරම හතුරා ඔබතුල තිබෙන ඔබගේ ආත්මයයි. මුහම්මද් (සල්) තුමා මෙසේ පැවසුහ. මනුෂ්‍යා අකුසලේ නිරතවීමත් ෂෙතාන් (සාතාන්)ට වහල්වීමත් ආත්මය දමනය කිරීමට නොහැකිවීමට හේතුවේ. ආත්ම දමනය කරන අතර ආශාවන්ට වහල් නොවී ජීවත්වීමට මෙම උපවාසය පුහුණුවක් ලබාදෙනු ඇත.

අල්ලාහ් දෙවියන්ට කීකරුවීම පිණිස තමාගේ ආත්මය සමඟ සටන් කරන්නා සත්‍ය වීරයා යැයි මුහම්මද් (සල්) තුමාණෝ පැවසුහ. මෙවැන්, වීරයින් කාම ආශාවේ ආකර්ෂනය ඉදිරියේ යටත් නොවන උත්තම පුරුෂයින් බිහි කිරීමේදී, මෙම උපවාසය ඉටු කරන කාර්යභාරය අසමසමයි.

ජීවිතයේ සෑම අංශයකම අල්ලාහ් දෙවියන් හැර වෙනත් කිසිවෙකුට කීකරු නොවන ධර්මිෂ්ඨ සමාජයක් ගොඩ නැංවීම ඉස්ලාමයේ පරමාර්ථයයි. මෙම සේවය ඉටුකිරීම සඳහා රමධාන් මස උපවාසය උපරිම පුහුණුවක් ලබාදෙනු ඇත.

සත්‍ය මෙසේ තිබුණත් වැදුම්පිදුම්වල ඉතා භයානක අනතුරක් සිදුවේ. එය ජීවයක් නොමැති වත්පිළිවෙත්සේ ඉටුකෙරෙනවාට කිසිදු සැකයක් නොමැත. සම්මයද මෙම අදහසින් වෙනස් නොවේ. මෙයට හේතුව සම්මය යනු කුසගින්නේ හා පිපාසයෙන් සිටීම යැයි වැරදිලෙස සිතා සිටීමවේ. ශරීරයේ කාමුක හැඟීමේ ශක්තිය මැඩලීම හේතුවෙන් ඉස්ලාමය ආහාරයෙන් හා පානයෙන් වැළකී සිටීම අනිවාර්ය කරයි. සම්මය එයින් නොනැවතී ඒ හැර සම්පූර්ණ ශරීර අංගයන්ම අයහපත් ක්‍රියාවන්වලින් ආරක්ෂාවිය යුතුයැයි එය බලාපොරොත්තුවෙයි. එවිට සම්මය සම්පූර්ණවේ. වැදුම්පිදුම් හා වත්පිළිවෙත් කිසියම් ප්‍රයෝජනයක් නොමැති තත්ත්වයකට පත්වීම ගැන මුහම්මද් (සල්) තුමාණෝ මෙසේ

පැවසුහ " නොයෙක් සවිමයේ යෙදී සිටි අය ඔවුන් සවිමයෙන් ලබාගන්නේ නිරාහාරව සිටීම පමණකි. නොයෙක් වැදුම්පිදුම් කරන්නන් එයින් ලබාගන්නේද රැයේ නින්දෙන් අවදිව සිටීම පමණකි. එය හැර කිසිදු ඵලයක් ඔවුන් ලබා නොගනී" යනුවයි.

සවිමයේ සත්‍ය අරමුණ ඉටුකර එයින් ලැබෙන සම්පූර්ණ ඵලයන් ලබාගැනීමට උත්සාහ කිරීම සවිමයේ යෙදෙන්නාට අනිවාර්‍යවේග එමනිසා පහත සඳහන් කරුණු පිළිපැදීමෙන් හා ආරක්ෂා කිරීමෙන් සවිමය සම්පූර්ණවේග

1- සවිමයේ සත්‍යතාවය, අල්ලාහ් එය අනිවාර්‍ය කල හේතූන් දැනගෙන අවබෝධ කරගෙන සවිමයේ නිරතවීම, දේව යහමග පෙන්වීම (සත්‍ය මාර්ගය) මේ පොළොවට පහළවූ දිනය උත්සවාකාරයෙන් සිහිපත් කරමු,එම උසස් දායාදයට අල්ලාහ්ට ස්තුතිවන්තවෙමු, යන හැඟීමෙන් සවිමයේ යෙදෙන්නෙමු යැයි මෙයින් කෙටියෙන් අදහස් කෙරේ.

2- සවිමය අනිවාර්‍ය වූ මාසයේ (රමධාන්) විශේෂයෙන් අනිවාර්‍ය කරන ලද නැමදුම්වල යෙදීම

තරාවීහ් යන නමින් හඳුන්වාදී ඇති විශේෂ සලාතයේ වැඩි වේලාවක් එයටම වෙන්කර යේදීම මෙයින් අදහස් කෙරේ එය නියමාකාරයෙන් ඉටුකර නියම ඵලයන් ලබා ගැනීමට උත්සාහ කිරීමද අදහස් වේ.

3- ඉ:තිකාෆ් හෙවත් පල්ලියේ රැඳීසිටීම

විශේෂයෙන් රමධාන් මාසයේ අවසාන දින දහය තුලදී ලෙලතුල් කද්ර් නම් වැදගත් රැයේ සම්පූර්ණ ඵල ලබාගැනීම සඳහා උත්සාහ කිරීම.

4- වැඩි වැඩියෙන් අල්කුර්ආනය පාරායනය කිරීම

මෙම මාසය අල්කුර්ආනය පහළවූ මාසය හෙයින් අල්කුර්ආනය පාරායනය කිරීමට හා එය අවබෝධ කරගැනීමෙහිලා වැඩි උනන්දුවක් සහ උත්සාහයක් දැක්වීම ඉතා ගැළපේ.

5- දන්දීම

දේව වක්තෘවරයාණන් වන මුහම්මද් තුමාණන් මෙම මාසයේ වැඩි වැඩියෙන් දන්දීමෙහි නිරතවූ බැවින් තමාට හැකි අයුරින් එහි නිරතවීම.

6- තහනම් කරන ලද කරුණුවලින් තමාගේ බැල්ම ආරක්ෂා කරගැනීම.

7- බොරුකීම කේළාමිකීම වැනි දේවලින් තමාගේ දිව ආරක්ෂා කරගැනීම.

8- ඉස්ලාමය තහනම් කර ඇති අප්‍රිය කරුණුවලට ඇහුම්කන්-දීමෙන් වැළකීම.

9- අනිකුත් ශරීර අංගයන් අයහපත් ක්‍රියාවන්ගෙන් ආරක්ෂා කරගැනීම.

10- වැඩි වැඩියෙන් ආහාර ගැනීමෙන් වැළකීම.

11- සවිමය බිඳින භවස් කාලයේදී එහි නිරතවන්නාගේ සිත්තුල බියක් හා බලාපොරොත්තුවක් එකට ඇතිවිය යුතුය. තමා සම්පූර්ණ කල සවිමය අල්ලාහ් ඉදිරියේ බාරගැනේද, ඔප්පුවී එයට පිං ලැබේද, නැතිනම් එය ප්‍රතික්ෂේපවී අල්ලාහ්ගේ කෝපයට ලක්විය යුතුද යනු සවිමයේ යෙදුනු කෙනෙක් නොදනී. එම නිසා යම්කිසි කරුණක් ඉටුකල විටකදී මෙම හැඟීම දාසයා යටත්වන්නා තුල ඇතිවිය යුතුය.

ඉහත සඳහන් පරිදි සෑම මුස්ලිම්වරයෙක්ම සම්පූර්ණවූ ආධ්‍යාත්මික පරිසරයකට මෙම මාසයෙහි පිවිසුනානම් ඉතා පිරිසිදුව ඔහු එයින් පිටවෙයි, යන්නට කිසිදු සැකයක් නොමැත. මෙසේ වසරේ එක් අවස්ථාවක්, ආත්මයෙහි පිරිහීගිය කොටස් යහපත් තත්ත්වයට පත්කිරීමටත්, සමාජයේ පැතිරී ගොස් ඇති වැරදීන් ඉවත්කිරීමටත්, මෙම මාසය මැනවින් ඉවහල්වේ.රමධාන් මාසය මෙම මාසයේ සිදුවූ ඓතිහාසික සිදුවීම් ඉස්ලාමය යලි නැගීසිටීම සඳහා උත්සාහවීමට අවශ්‍ය හැඟීම් ලබාදිය යුතුයි. විශේෂයෙන් ඉස්ලාමය නැගීසිටින යුගයක වෙසෙන අපි මෙම හැඟීම් ඇති කරගැනීම ඉතා වැදගත්වේ.

RAMADAN MASAYE
UPARIMA PALA
NELAGANEEMATANAM
Fasting in islam (Singhala)

Author : Sajahan Abdul Cader
B.A. (Cey) Naleemi
Second Edition : Augest, 2004
Copies : 2000
Published by : Islam Presentation Committee
Fahad Al -Salem St.
AL. Mulla Saleh Mosque,
Kuwait
P.O.Box. 1613, Safat. 13017
Kuwait.
Tel. 2447526 Ext. 260, 151
Http. www.Islam.com.kw
Typeset by : Br.Yasir
Printed at : Kuwait

උපවාසයේ නීතිරීති

උපවාසයේ අනිවාර්ය වගකීම් (පරිල්) දෙකක් ගැන සඳහන්වේ.

1- උපවාසයේ යෙදෙන බවට සිතින් අධිෂ්ඨාන කරගැනීම, එනම් උපවාසයේ යෙදෙන්නට පෙරවූ රැයේ ඉර බැසගිය වේලාවේ සිට සුබහ් පපර් සලාතය ආරම්භ කිරීමේ කාලය දක්වාවූ කාලසීමාව තුල උපවාසයේ යෙදීම සිතින් අධිෂ්ඨාන කරගත යුතුයි.

2- හිමිදිරි උදෑසන සිට ඉර බැසීම දක්වා වූ කාලසීමාව තුලදී උපවාසය නිෂ්ඵල වන කරුණුවලින් වැළකීසිටීම.

උපවාසයේ පිළිපැදිය යුතු විනයන්

උපවාසයේ යෙදෙන්නන් පහත සඳහන් විනයන් පිළිපැදීමෙන් උපවාසයේ නියම ප්‍රයෝජනයන් ලබාගත හැක.

1- සහර් හෙවත් ආහාර ගැනීම :

උපවාසිකයෙක් උදෑසන ආහාරය (සහර්) ගැනීම වක්තෘවරයාණන් වන මුහම්මද්තුමාගේ සිරිතක්ව තිබුණි. එම ආහාර ගැනීමෙන් වැළකී සිටීම වරදක් නොවේ. මුහම්මද්තුමා මෙසේ පැවසුහ, "ඔබ උදෑසන ආහාරය (සුහුර) අනුභව කරන්න එම ආහාරයෙහි අභිවෘද්ධියත් අල්ලාහ්ගේ කරුණාවත් තිබේ" (බුහාරි මුස්ලිම්)

2- ප්‍රමාද නොවී උපවාසය විවෘත කිරීම

ඉර බැසීමත් සමග ප්‍රමාද නොවී උපවාසය විවෘත කිරීමද මුහම්මද්තුමාගේ සිරිතක් වේ. ප්‍රමාද නොවී උපවාසය විවෘත කරනා විටදී එහි නිරතවන්නන් පිං (යහපත් දේ) ලබාගනී, යනුවෙන් වක්තෘවරයා පැවසුහ. (බුහාරි මුස්ලිම්) මේ සඳහා රටඉදි හෝ වතුර ලබා ගැනීමද මුහම්මද්තුමාගේ සිරිතක් විය.

3- උපවාසයේ යෙදී සිටින විටදී හා එය හමාර කරන විටදී ප්‍රාර්තනාවන්හි යෙදීම. තුන්දෙනෙකුගේ ප්‍රාර්ථනාවන් ප්‍රතික්ෂේප නොකෙරේ. සවිමයේ යෙදෙන්නා එහි නිරතවනතෙක් අවංක නායකයෙක් අසාධාරණයට ලක්වූතැනැත්තා " යනුවෙන් මුහම්මද්තුමාණෝ පවසා

ඇත. (තිර්මිදි)

4- අයහපත් ක්‍රියාවන්ගෙන් මිදිසිටීම.

උපවාසයේ යෙදෙන්නන් අයහපත් ක්‍රියාවලින් මිදී සිටින්නයැයි ඉස්ලාමය සඳහන් කරයි. ආහාරයන්ගෙන් හා පානයන්ගෙන් වැළකී සිටීම පමණක් උපවාසය නොවේ. අසභ්‍ය වචනයන්ගෙන් හා දුරාචාර හැසිරීමෙන් වැළකීසිටීම උපවාසය වේ. යමෙක් ඔබට බැන වදින්නේ හෝ ඔබ සමග දබර කරන්නේනම් "අහෝ සොයුර මම උපවාසිකයෙක්මි මා හට පිළිතුරුදීමට නොහැක " යයි කියන්න යැයි වක්තෘ මුහම්මද් (සල්) තුමාණෝ පැවසූහ

5- දත් මැදීම : දත් පිරිසිදු කර ආරක්ෂා කිරීම සඳහා උපවාසිකයෙක් දත්මැදීම මුහම්මද් වක්තෘවරයාණන්ගේ සිරිතක් විය මුහම්මද් වක්තෘවරයාණන් උපවාසයේ යෙදෙනවිටදී සෑමවිටම දත් පිරිසිදු කිරීම තමා දැක ඇතිබවට ආමින් මින් රබිආ (රලි)පවසයි (අබුදවුද් අහමද් තිර්මිදි)

6- අල්කුර්ආනය පාරායනය කිරීම සහ ඉගෙනගැනීම: දිනපතා අල්කුර්ආනය පාරායනය කිරීම හා එය ඉගෙනගැනීම යහපත් කරුණකි විශේෂයෙන් රමධාන් මාසයේ මෙය වැදගත්වේ

7- රමධාන් මාසයේ අවසන් කොටසෙහි වැඩි වැඩියෙන් වැඳුම් පිදුම්වල නිරතවීම: ආයිෂා (රලි) තුමිය මෙසේ සඳහන් කලාය වක්තෘ මුහම්මද් (සල්)තුමාණන් රමධානයේ අවසන් දින දහය ලැබුවිටදී රැයෙහි නින්දෙන් අවදිවී සලාතයෙහි යෙදුනහ තමාගේ පවුලේ උදවියද අවදි කලේය තමා දීර්ග සලාතයක නිරතවීමට සුදුනම් වන ආකාරයට තමාගේ ඇඳුම් තදින් බැඳ ගනියි

මෙම උත්තරීතර මාසයේ වැඩි වේලාවක් පල්ලියෙහි (මස්ජිද්හි) ගතකර ඉ:තිකාෆ් රැඳී සිටියහ ඒ හැර අනිවාර්ය නොවන අධික වැඳුම් පිදුම්වල යෙදීමද යහපත් ක්‍රියාවන් යාඥාකිරීම සමාව අයැදීම ආදීන් වක්තෘවරයාණන්ගේ සිරිත්වේ

උපවාසය නිෂ්ඵල වන කරුණු

උපවාසයේ යෙදෙන්නා එය නිෂ්ඵල වන කරුණුවලින් තොරව

සිටිය යුතුය. පහත සඳහන් කරුණු එසේ උපවාසය නිශ්ඵල කරයි.

1- ඕනෑකමින් ආහාර ගැනීම හෝ පානය කිරීම: නොදැනීමෙන් බලකිරීමෙන් හෝ අමතකවීමෙන් යන හේතුවලින් යම් ආහාරයක් හෝ පානයක් ගැනීම සිදුවුවහොත් උපවාසය නිශ්ඵල නොවේ.

2- ඕනෑකමින් හිතාමතා වමනය පිටකිරීම: ස්වභාවයෙන් යමෙකුට වමනය පිටවෙනම් එයින් උපවාසය නිශ්ඵල නොවේ.

3- කාන්තාවකට ඔසප්වීම ඇතිවීම.

4- දරු ප්‍රසූතියට පසුව ලේ පිටවීම: මේ අවස්ථාවේදී ලේ නැවතීමත් සමගම ස්නානය කර ඉන් අනතුරුව උපවාසයේ යෙදීම අනිවාර්ය වේ.

5- ධාතු පිට කිරීම : ඇල්ලීම සිඹීම වැළඳගැනීම යනාදිය කිරීමෙන් ධාතු පිටවුවහොත් සවිමය නිෂ්ඵල වේ. එසේ ධාතු පිට නොවූ විටදී උපවාසය නිෂ්ඵල නොවේ. නින්දේ සිටින අවස්ථාවන්හිදී සිහිනෙන් එය පිටවූ විටදීද සවිමය නිෂ්ඵල නොවේ.

6- ආහාරයක් ලෙස කෑමට නොගන්නා දෙයක් තම උදරය වෙත ගැනීම. උදාහරණ : ලුණු ආදිය ගැනීම, දුම්බීම.

7- උපවාසය ඕනෑකමින් නිෂ්ඵල කරගන්නවායැයි තමාතුල හැඟීමක් ඇතිකර ගැනීම.

8- දවල් කාලයේ ලිංගික ආස්වාදයේ යෙදීම: ලිංගික ආස්වාදයේ යෙදීම හැර අනිකකින් උපවාසය නිෂ්ඵල වන කරුණුවල යෙදෙන්නා එම උපවාසයේ වෙනත් දිනයකදී යෙදීම අනිවාර්ය වේ. ලිංගික ආස්වාදයේ යෙදීමෙන් උපවාසය නිෂ්ඵල වේනම් ඔහු වෙනත් දිනයකදී එය ඉටු කරනවාත් සමග ඒ වෙනුවෙන් කෂ්ණාරා නම් වන්දියද ගෙවිය යුතුය. එම වන්දිය නම් ඔහු වහලෙක්ව නිදහස් කල යුතුය. එය ඔහුට කරන්නට නුපුළුවන් වේනම් නොකඩවා මාස දෙකක් උපවාසයේ යෙදිය යුතුය. එයද කරන්නට ඔහු අපොහොසත් වූ විටදී දුගියන් හැට දෙනෙකුට දිනයකට ඔහු ආහාර සැපයිය යුතුය.

උපවාසිකයා අවසරලත් ක්‍රියාවන්

1- ජලයේ ගිලීනෑම. (ස්නානය කිරීම, ශරීරය ශීතල කිරීම)

2- ඇස්වල සුරුමා තීන්ත දැමීම.

3- බිරිඳ වැළඳගැනීම. (තමාගේ ආශාවන් මෙල්ලකර ගතහැකිය සිතන උපවාසිකයන්ට මෙයට අවසර ලැබෙයි)

4- බෙහෙත් විදීම : ආහාරය වෙනුවෙන් එන්නත් මාර්ගයෙන් බෙහෙත් විදීමක් නොකර සාමාන්‍ය බෙහෙත් විදීමක් කරගන්නට අවසර ඇත.

5- උපවාසිකයාගේ ශරීරයෙන් ලේ ලබා ගැනීම.

6- කට සෝදා ගැනීම, නාසයට වතුර යේදීම, උණුයෙන් වෙහෙසට පත්වී අසීරු තත්ත්වයට පත්වන උපවාසිකයා ශරීරය ජලයෙන් තෙත්කිරීම. වායු සමනය කරන ලද ස්ථානයකට ඇතුළුවීම, දෙතොල් තෙත්කර ගැනීම.

7- වැළකී සිටින්නට නොහැකි දෙයක් කටින් ඇතුළුවීම උදාහරණ : කෙළ.

8- ඉර බැස ගිය වේලාවේ සිට හිමිදිරි උදැසන දක්වා කාලය තුළදී ආහාර පාන අනුභව කිරීමටද ලිංගික ආස්වාදයේ යෙදීමටද අවසර ඇත.

9- ස්නානයට අනිවාර්යවූ උපවාසයේ යෙදෙන්නා එසේ උපවාසය ආරම්භ කර අදන්(සලාතයට කැඳවීම) ලැබුවායින් පසු ස්නානය කරගතයුතුයි.

10- හිමිදිරි උදැසනම යම් ස්ත්‍රී කෙනෙකුගේ ඔසප්වීමෙන් හෝ ප්‍රසූතියෙන් ගලන රුධිරය නැවතීමත් සමගම ඇය උපවාසයේ යෙදිය යුතු අතර ඇය අදන් (සලාතයට කැඳවීම) ලැබූ වහාම ස්නානය කර ගැනීමට අවසර ඇත.

උපවාසය හා ශරීර සෞඛ්‍යය

ඉස්ලාමික නීතිරීති හා වෛද්‍ය සත්‍යතාව අතර කිට්ටු සම්බන්ධතා තිබීම දැකගත හැක. ඉස්ලාමික නීතිරීති ගැන වෛද්‍ය තොරතුරු පෙන්වාදීමත් ඉස්ලාමික නීතිරීති තහනම් කලදේ වෛද්‍ය තොරතුරු අනතුරු ඇගවීමත් දැකගත හැක. රමඩානයේ මුස්ලිම්වරුන්

පිළිපදින විනය මනා හැසිරීම දෙස බැලුකල මෙය දැකගත හැක.

අවශ්‍යයට වඩා ආහාර අනුභව කල යුතුද ?

යමෙකු මාස එකොළහක් පුරාම කාල වේලාවකින් තොරව තමාගේ කුස අධික ලෙස ආහාර පානවලින් පුරවා ගනිමින් ජීවත්වෙයි. නමුත්, රමධාන් මාසය උදාවු විට උපවාස කාලයේ දී, ආමාශය සඳහා කෙටි විවේකයක් ලැබෙනු ඇත. මෙනිසා, එය නැවත නිරෝගිමත්ව හා ප්‍රාණවත් ව ක්‍රියාත්මකවීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරිත්වය ලබා දෙනවා ඇත. වක්තෘවරයාණන් මෙසේ පැවසුහ " මිනිසා පුරවන උරවල ඉතාම නොහොඳ උරය ඔහුගේ කුසවේ " යයි

රමධාන් මාසයේ ඔබේ ශරීර සෞඛ්‍ය ආරක්ෂාව සඳහාවූ උපදෙස්

ඉස්ලාම් ධර්මය තුලින් අපවෙත ඉදිරිපත් කර ඇති විවිධ වත්පිළිවෙත් අපගේ ශරීර සොඛ්‍ය තත්ත්වය රැකගැනීමටද රුකුලක් වී ඇත. අපි රමධාන් මාසයේ පිළිපදින ක්‍රියාවන් අපගේ සනීපාරක්ෂාව රැකගැනීමට ඉමහත් කොටස් කරුවෙක් වී ඇත. එමනිසා රමධාන් මාසයේ අපි පිළිපැදිය යුතු කරුණු සම්බන්ධව දැනගැනීමට මෙම අවස්ථාව උපයෝගි කර ගනිමු

1- අධික ලෙස ආහාර ගැනිමෙන් කුසට සිදුවන හානි: අප අතර සමහරුන් උපවාසයෙන් මිදී ආහාර ගන්නා විට අධික ලෙස ආහාර අනුභව කරමින් කුස පුරවා ගනිති. මෙම අවස්ථාවේදී ඇත්ත වශයෙන්ම කුස වෙහෙසට පත් වී තිබීම නිසා ඝණීකව ජීර්ණ පද්ධතිය ක්‍රියාත්මක වන්නේ නැත. එමනිසා මුහම්මද් (සල්) නබිතුමාණන් මෙසේ පවසා ඇත. "මිනිසා තමන්ගේ කුසට වැඩිපුර ආහාර ගන්නා විට ඔහුගේ කුස රෝගි තත්ත්වයට පත්වනවා ඇත".

2- රට ඉදි වලින් උපවාසයෙන් මිදීම: මුහම්මද් (සල්) නබිතුමාණන් මෙසේ පවසා ඇත. "ඔබලා උපවාසයෙන් මිදෙනවානම් රට ඉදි වලින් උපවාසයෙන් මිදෙන්න" එය ඔබට ආශිර්වාද ගෙන එයි. රට ඉදි නොලැබෙන අවස්ථාවක ජලය පානය කර උපවාසයෙන්

මිදෙන්න, එය ඔබගේ සනීපාරක්ෂාවට රුකුලක් වනවා ඇත. සියළුම හදීස් ග්‍රන්ථවල මේ සම්බන්ධව සඳහන් වී ඇත. රට ඉදි වලින් උපවාසයෙන් මිදීමෙන් අතිවිශේෂ පීවමානී ප්‍රයෝජන අප ශරීරයට ලැබේ. රටඉදි වල ඇති ග්ලුකෝස් ශක්තිය ක්ෂණිකව උරාගැනීමට වෙහෙසටපත් ආමාශයට ප්‍රශ්ණයක් වන්නේනැත.

මෙම ක්‍රියාව මොහොතකදී සිදුවන නිසා ශරීරය පුරා ශක්තිය පැතිරීමට රටඉදි අනුභව කිරීම රුකුලක්වනවා ඇත. රටඉදි අනුභව කිරීම අක්මාවට විශේෂ ශක්තියක් ලබාදෙන අතර කුඩා බඩවැල තුල හැදෙන බැක්ටීරියා වැනි විශ ඕජද විනාශ කරයි.නවීන විද්‍යා පර්යේෂණ අනුව රටඉදි වල 6% සිට 7% දක්වා ප්‍රමාණයක් කාබෝහයිඩ්‍රේට් අඩංගු වී ඇත. එමෙන්ම තෙල් වර්ග 2% ක්ද, ඛණිජ වර්ග 1.32% ක්ද 10% ක් පමණ විටමින් වර්ගද අඩංගු වී ඇත. විශේෂයෙන් විටමින් බී සහ බී2 රටඉදි වලින් ලැබේ. මීට අමතරව යකඩ පොස්පරස්, පොටෑසියම්, තඹ, කාබන්, කැල්සියම්, මැග්නීසියම් වැනි ඛණිජ වර්ගද සුළු ප්‍රමාණයක් එහි ඇත.

නිසැකයෙන්ම දේව නිර්මාන අතරින් ඉදි ගස තවත් කිසිම ආහාරයක් සමඟ සන්සන්දනය කල නොහැකි ආහාරයකි. අපගේ ශරීර ශක්තියට මස්පිඩු නහර සහ කොඳු ඇටවලට රටඉදි අතිශයින් උපකාරීවේ.

මෙම රටඉදි සමඟ කිරි එකතු කර ගන්නා විට ඔබට අති විශේෂ පල නෙලා ගැනීමට හැක. කුඩා දරුවන්ටද රටඉදි ඉතා ප්‍රයෝජනවත් ආහාරයකි දරුවන්ගේ බර වැඩිවීමටද, ඇස්වල පෙනීමේ ශක්තිය රැකගැනීමටද, වර්ධනයවීමටද, මූත්‍රා මාර්ගය පිරිසිදු කිරීමටද, අක්මාව පිරිසිදු කිරීමට සහ ශරීරයේ අවයවයන් සියල්ල නිසියාකාරව ක්‍රියා කිරීමටද, රටඉදි ප්‍රයෝජනවත්වේ. නමුත් රටඉදි වැඩි වශයෙන් අනුභව කිරීම නිසා සෞඛ්‍ය තත්ත්වයට අහිතකර වීමට ඉඩ ඇත. (දිය වැඩියාවෙන් පීඩාවට පත්වූ අය රටඉදි අනුභව කිරීම සීමා කල යුතුයි)

3- රෝගී තත්ත්වයක් නිසා හෝ මහළුභාවය නිසා උපවාස ශීලයේ යෙදීමට නොහැකි අය සම්බන්ධ ඉස්ලාමිය නීතිය: වෛද්‍ය උපදෙස් අනුව කෙනෙකුට උපවාසයේ යෙදීම තහනම් වන අවස්ථාවේදී

ඔහුට උපවාසය අනිවාර්යය්‍ය වන්නේ නැත. නමුත් එවැනි අවස්ථාවක ඔවුන් උපවාසයේ නොයෙදෙන සියළු දිනයක් වෙනුවෙන්ම දුගී දුප්පතුන්ට ආහාර සැපයිය යුතුයි. මෙම ආහාරය රටේ ප්‍රසිද්ධ ප්‍රධාන ආහාරයක් විය යුතුයි. රටඉඳි වලින් හෝ හාල්වලින් මෙය ප්‍රධානය කිරීමට පුළුවන. නමුත් රෝගි තත්ත්වයෙන් මිදෙන යමෙකුට මෙම කොන්දේසිය අදාලවන්නේ නැත. ඔහු නීරෝගිමත්වූ වහාම මඟ හැරුනු. උපවාස සියල්ලක්ම නැවත ඉටුකල යුතුයි. හේතුව අල්කුර් ආනය මෙසේ පවසයි, "ඔබගෙන් යමෙකු රෝගි වුවහොත් හෝ ගමනක යෙදී සිටියහොත් හෝ ඔහු එම දින ගණන් කරමින් වෙනත් දිනවල උපවාසයේ යෙදිය යුතුයි".

4- නහර සහ මස්පිඩු තුලින් බෙහෙත් විදීම : මෙම ක්‍රියාවන් යමෙකුගේ උපවාසයට කිසිම හානියක් කරන්නේ නැත. නමුත් ආහාර වශයෙන් ලබාදෙන සියළුම එන්නත් ක්‍රම නිසා උපවාසය නිශ්ඵල වනවා ඇත. එමෙන්ම ලේ පරීක්ෂා කිරීම නිසා උපවාසය නිශ්ඵල වන්නේ නැත. නමුත් හිසෙන් ලේ ගන්නා විට උපවාසය නිශ්ඵලවේ.

5- දත් බෙහෙත් සහ ඇස් බෙහෙත් පාවිච්චි කිරීම : දත් බෙහෙත් උපයෝගි කර ගැනීම නිසා උපවාසය නිශ්ඵල වන්නේ නැත. හේතුව එය ආහාරයක් නොවීමයි. එමෙන්ම ඇස් සහ කනට අදාල බෙහෙත් ඇතුලත් කිරීමෙන්ද උපවාසය නිශ්ඵල වන්නේ නැත. හේතුව මෙම මාර්ග කුසට ආහාර ලබාදෙන මාර්ගයන් නොවීමයි. නමුත් නාසය තුලින් බෙහෙත් ඇතුලත් කිරීම උපවාසය නිශ්ඵල වීමට හේතුවෙයි.

හේතුව වන්නේ එය ආහාර ඇතුලත් කල හැකි ප්‍රධාන මාර්ගයක් වීමයි.

6- දත් මැදීම (පිරිසිදු කිරීම) : දිවාකාලය ආරම්භයේදී හෝ අවසානයේදී හෝ දත් මැදීමට අනුමත ඇත. නමුත් හිරු මුදුන්වුවාට පසු දත් මැදීමෙන් වැලකීම වැදගත් වන බවටත් අදහස් ඉදිරිපත් වී ඇත. නමුත් මුහම්මද් (සල්) නබිතුමාණන්ගේ පැවසීම අනුව දත් පිරිමැදීම නිසා උපවාසයට හානියක් ඇති වන්නේ නැත. එනම් "දත් මැදීම මුඛයට පිරිසිදුවක් ලබාදෙන අතර අල්ලාහ් දෙවියන් වහන්සේගේ තෘප්තියටත් හේතුවක් වනවා ඇත" යනුවෙන් මුහම්මද් (සල්)

නබිතුමාණන් පවසා ඇත. එමෙන්ම මුහම්මද් (සල්) නබිතුමාණන් මෙසේද ප්‍රකාශ කර ඇත. එනම් 'මාගේ ජනතාවට දුශ්කරතාවයක් ඇතිවන්නේ නැතිනම් සෑම (සලාතයන්ට) නැමදීම්වලට පෙර දත් මැදීමට මා අණ කරමි. මෙම අදහසින් මැදීමට මා අණ කරමි. මෙම අදහසින් ලුහර් සහ අසර් සලාතයද පෙන්වා දෙනු ලැබේ'.

7- දන්ත ප්‍රතිකාර ලබා ගැනීම: දන්ත ප්‍රතිකාර ලබා ගැනීමට බෙහෙත් එන්නත් කිරීමේදී හෝ දතක් ඉවත් කිරීමේදී හෝ දත් මැදීමේදී හෝ එය උපවාසය නිශ්ඵල වීමට අදාල හේතුවක් වන්නේ නැත. එමෙන්ම මෙවැනි අවස්ථාවලදී භාවිතාවන බෙහෙත්, ආහාර වශයෙන් උපයෝගි නොවීම නිසා උපවාස ශීලය රකින්නාගේ උපවාසයට හානියක් සිදුවන්නේ නැත.

8- ඇදුම රෝගීන් උපවාසය රකින්නේ කෙසේද?

උපවාසය ආරක්ෂා කරන ඇදුම රෝගියෙකුගේ මුඛයට බෙහෙත් (ස්ප්‍රේ) කිරීම නිසා උපවාසය නිශ්ඵල වන්නේ නැත. නමුත් දරාගන්න බැරි අවස්ථාවක පමණක් බෙහෙත් (ස්ප්‍රේ) කිරීම වැදගත් වෙයි. මෙයද ආහාරයක් නොවේ. මෙයට හේතුව ශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ පවසා තිබීමයි. දරාගැනීමට බැරි අවස්ථාවක හැර සියළුම තහනම් ක්‍රියාවන් අපි ඔබලාට පැහැදිලි කළෙමු.

9- මුඛයට භාවිතා කරන සුවඳ විලවුන් වර්ග භාවිතා කිරීමෙන් උපවාසය නිෂ්ඵල වෙනවාද?

මුඛය තුල පවතින දුර්ගන්ධය නැති කිරීමට උපයෝගිවන බෙහෙත් වර්ග අද බෙහෙත් ශාලාවල ඇත. මේ සම්බන්ධව ස්ථිරව සඳහන් කිරීමට නොහැකි නිසා මෙම ක්‍රියාවෙන් ඈත්වී සිටීම වැදගත් වෙයි.

10- නාසයෙන් ලේ පිටවීම, ලේ පරීක්ෂා කිරීම, ලේ දන්දීම නාසයෙන් ලේ පිටවීම සහ කාන්තාවන්ට අසාමාන්‍ය රුධිරය පිටවීම නිසා උපවාසය නිශ්ඵල වන්නේ නැත. නමුත් මාසික ශුද්ධිය දරු ප්‍රසූතියට පසු රුධිරය පිටවීම සහ හිසෙන් ලේ ලබා ගැනීම නිසා උපවාසය නිශ්ඵලවෙයි. අවශ්‍යවන ලේ පරීක්ෂා කිරීම නිසා උපවාසයට හානියක් වන්නේ නැත. නමුත් ලේ දන්දීම උපවාසයෙන් මිදුනාට පසුව

ලබා දෙන්නේ නම් ඉතා හොඳය. හේතුව ලේ දන්දීම හිසෙන් ලේ ලබාගැනීම හා සමාන ක්‍රියාවක්වීමයි.

11- වමනය පිටවීමෙන් උපවාසය නිශ්ඵල වෙනවාද? වමනය පිටවීමෙන් උපවාසය නිශ්ඵල වන්නේ නැත.නමුත් හිතාමතා වමනය පිටකරන විට උපවාසය නිශ්ඵල වෙයි. නාසයෙන් ලේ පිටවීම නිසා හෝ වමනය පිටවීම නිසා හෝ එසේත් නොමැතිනම් අමතක වීමක් නිසා හෝ ඉන්ධන හෝ වතුර බඩට ඇතුල්වීමේ හේතුවෙන් හෝ උපවාසය නිශ්ඵල වන්නේ නැත. හේතුව මුහම්මද් (සල්) නබිතුමාණන් මෙසේ පවසා තිබීමයි " යමෙකුට වමනය පිටවුවානම් උපවාසය නිශ්ඵල වන්නේ නැත" නමුත් හිතාමතා වමනය පිට කරන අවස්ථාවේදී උපවාසය නිශ්ඵල වනවා ඇත"

12- වස්ති කිරීම සහ අදෝමාර්ගයෙන් එන්නත් ලබාදීම : මලපහ කිරීමට අසීරුනම් යමෙකු මෙම පිළිවෙත පිළිපැදීමට ඉස්ලාමය අනුමතය ලබා දී ඇත. මෙම ක්‍රියාව නිසා උපවාසය නිශ්ඵල වන්නේ නැත. හේතුව මෙම ක්‍රියාවෙන් ආහාර පාන සැපයීමක් සිදුනොවීමයි.

13- රසායන බෙහෙත් ප්‍රතිකාර: යමෙකු රෝගී තත්ත්වයෙන් සිටින අවස්ථාවේදී උපවාසයේ යෙදීමට ඉස්ලාම් බලකරන්නේ නැත. යමෙකුට අවශ්‍යය රසායනික බෙහෙත් ප්‍රතිකාර දිවා කාලයේදී ලබාදීමට අවශ්‍ය නම් ඔහුට උපවාසය අනිවාර්ය්‍ය වන්නේනැත. හේතුව ශුද්ධවූ අල්කුර්ආනය මෙසේ පැවසීමයි. (යමෙකු රෝගී තත්ත්වයට පත්වනවිට හෝ යහපත් ගමනක යෙදී සිටිනවිට ඔහු දින ගණන් කරමින් වෙනත් දිනයන්හි මග හැරී ගිය උපවාසයන් ඉටු කල යුතුය) එමෙන්ම අල්ලාහ් දෙවියන් වහන්සේගෙන් අපට ලැබෙන වරප්‍රසාද කෙරෙහි අපගේ අවධානය යොමුකිරීමද වැදගත්වේ. එනම් අල්ලාහ් විසින් රෝගින්ට සහ මගීන්ට ලබාදී ඇති මෙම වරප්‍රසාදය උපයෝගී කරගැනීම සියළු දෙනාගේම වගකීමකි.

අල්ලාහ්ගේ වක්තෘවරයාණන් මෙසේ පැවසුහ, "උපවාසිකයෙකු හට එය අවසන් කිරීමට කවරෙකු ආහාර සපයන්නේද, ඔහුගේ පරිදෘනය උපවාසිකයෙකුගේ පරිදනයට සමාන වන්නේය, එහෙත් ආහාර ලැබූ අයගේ පරිදනයේ කිසිදු අඩුවක් වන්නේද නැත" (තිර්මිදි)

රමධාන් මාසයේ ඉටුකළ යුතු විශේෂ ආගමික වතාවත්

තරාවීහ් සලාතය

(කියාමුල් ලෙයිල් හෙවත් රාත්‍රී නැමදුම)

රමධාන් මාසයේ සෑම රාත්‍රියකම තරාවීහ් නම් මෙම සලාතය ඉටුකිරීම මුහම්මද් තුමාණන්ගේ අනිවාර්ය මග පෙන්වීම්වලට අයත්වේ. එය සමූහව ඉටු කිරීමද එසේම වැදගත්වේ. රාත්‍රී ඉෂා සලාතයෙන් පසු මෙය ඉටුකල යුතුය.

මුහම්මද්තුමාණන් මෙම තරාවීහ් සලාතය ඉටුකල බවට බුහාරි මුස්ලිම් ග්‍රන්ථයන් වල සඳහන් වී ඇත. වක්තෘ මුහම්මද් (සල්) තුමාණන් රමධාන් මාසයේ විසිතුන, විසිපහ, විසිහත යන දිනයන්හි මධ්‍යම රාත්‍රියෙහි මස්ජීදයට පැමිණ තරාවීහ් සලාතය ඉටුකලහ. ජනයාද ඔහු පිටුපසින් එම නැමදුම ඉටුකලහ. එතුමාණන් රක්අත් කිහිපයක් එකටම ඉටුකලායින් පසු ජනයා ඉතිරි කොටස තම තමන්ගේ නිවෙස්වල එය සම්පූර්ණ කලහ. එවිට ඒ අය තුලින් මී මැසි රොන් ශබ්දය මෙන් ඇසෙන්නට විය. (බුහාරි මුස්ලිම්)

නබිතුමාණන්ගේ මිත්‍රයන්ගේ කාලයන්හිදී ඔවුන් තනි තනිව මෙම සලාතය ඉටුකලහ. මෙය දැකගත් උමර් (රලි) නම් නායකයාණන් එතුමන්ගේ රාජ්‍ය පාලනය කල කාලයේ මෙම සලාතය සැමදෙනාම එකටවී ඉටුකිරීම යහපත්යැයි පැවසුහ. අනිකුත් අය එතැන් සිට එය එකතුවී ඉටු කරන ලදී.

උමර් (රලි) තුමාණන්ගේ කාලයෙහි මිනිසුන් මෙය රක්අත් 20 ක වශයෙන් ඉටුකලහ. (අල් මුවත්තා) එනම් තරාවීහ් නම් සලාතය විත්ර් නම් සලාතයේ රක්අත් 3 ක් සම්බන්ධ කර රක්අත් 23 ක් ඉටුකලහ. උමර් (රලි) තුමාණන් මෙසේ සලාතය ඉටුකල ආකාරය අනිකුත් මිත්‍රයින්ද සම්මත කලහ. මෙයින් තරාවීහ් නම් සලාතය සුන්නත් නම් අනිවාර්ය නොවන සලාතයක් යනු පැහැදිලිය. එය

පටුන

පිළිගැන්වීම

ඉස්ලාම් හඳුන්වාදීමේ කමිටුව (IPC) ගැන බිඳක් කතාගෙන්...

පෙරවදන...

1. සවිමය යනු 08
2. රමධාන්හි වැදගත්කම 08
3. රමධානය ප්‍රීති උළෙලක්(උත්සවයක්) 09
4. රමධාන්හි ඉගෙනීම් 12
5. සවිමය ගැන මුහම්මද්තුමාණන් පැවසූ වදන් 13
6. සවිමයේ සම්පූර්ණ ඵල ලබාගැනීම සඳහා 14
7. ශුද්ධාවන්තභාවය වර්ධනය කිරීමට 15
8. අල්ලාහ්ගේ ආශිර්වාද අගය කිරීමට 15
9. දුගී දුප්පතුන්ව දුප්පත්භාවයෙන් මුදවාහැරීමට 16
10. ආත්ම දමනය කිරීම සඳහා 17
11. සවිමය සත්‍ය අරමුණු ඉටු කිරීමට නම් 18
12. සවිමයේ නීතිරීති 17
13. සවිමයේ පිළිපැදිය යුතු විනයන් 20
14. උපවාසය නිෂ්ඵල වන කරුණු 21
15. සවිමයේ යෙදෙන්නා අවසර ලත් ක්‍රියාවන් 23
16. උපවාසය හා ශරීර සෞඛ්‍යය 23
17. රමධාන් මාසයේ විශේෂ ආගමික වතාවත් 29
18. තරාවීහ් සලාතය (කියාමුල් ලෙයිල්) 29
19. ඉ:තිකාෆ් (පල්ලියතුල රැඳීසිටීම) 30
20. සකාතුල් පිත්ර හා නීතිරීති 32
21. රමධාන්හි ජයග්‍රහණයන් 35

කණ්ඩායම් වශයෙන් ඉටුකිරීම යහපත්ය. මුහම්මද් (සල්) තුමාණන් රමධාන් මාසයේ රැයයන්හි සිටගෙන නැමදුම් ඉටුකරන්නයි අණ කළහ. මුහම්මද් (සල්) තුමාණන් අනිවාර්ය නොකලත් රැයේ සිටගෙන වැඳුම් පිදුම් වල නිරතවෙන්නයි පැවසුබව අබුහුරෙයිරා නම් ඔහුගේ මිත්‍රයානන් සඳහන් කරයි. තවද යමෙක් විශ්වාසයෙන් යුතුව පිං බලාපොරොත්තුවෙන් රමධාන් මස රැයයන්හි සිටගෙන වැඳුම් පිදුම් වල නිරතවන්නේනම් ඔහුගේ පෙර කල පාපයන් සමා කරනු ලැබේ, යනුවෙන් දේව වක්තෘවරයාණන් වන මුහම්මද් (සල්) තුමා පැවසුහ.

සලාත නැමදුමෙහි ජීවය යමෙකුගේ සිත්තුල ඇතිවන දේව භක්තියයි. එම නිසා යමෙක් රක්අත් නම් ක්‍රියාවන්වල ගනනෙහි අවධානය යොමු නොකර මෙම සලාතය සිතේ භක්තියෙන් ඉටුකිරීම ඉතා වැදගත්වේ. තමා පාරායනය කරන අල්කුර්ආනයේ වදන් හොඳින් සිතා අවබෝධ කරගෙන භක්තියෙන් ඉටුකරන රක්අත් කිහිපයක් එවැනි හැඟීමෙන් තොර ඉටුකරන රක්අත් ගනනාවකට වැඩියෙන් යහපත්වේ.

දේව වක්තෘ මුහම්මද් (සල්) තුමාණන් මිනිසුන් අතරේ රමධාන්හි වැදගත් දානපතියෙක්ව සිටියහ. එහෙත් විශේෂයෙන් රමධාන් මාසයෙහි දේවදූත ජිබ්රයිල්(අලෙ)තුමාණන් නබිතුමාණන්ව මුණගැසෙන විටකදී සමස්ත ලෝකයේ සෑම ජීවියෙකුටම නව පණක් ප්‍රබෝධයක් ලබාදෙමින් හමායන සුළඟක් සේ ඉතා වැඩියෙන් දන්දෙමින් සිටියහ.

ජිබ්රයිල්(අලෙ) තුමාණන් නබිතුමාණන්ව රමධානයේ සෑම රැයකම මුණ ගැසී අල්කුර්ආනය උගැන්වූහ. එවිට මුහම්මද්(සල්) තුමාණන් හමායන සුළඟටත් වඩා දන්දීමෙහි යහපත්ව සිටියහ.

ඉ:තිකාෆ් (පල්ලියේ රැඳී සිටීම)

ඉ:තිකාෆ් යනු ලෞකික ආශාවන්ගෙන් තුරන් වී මිනිස් හැඟීම් සහ සිතුවිලි ලෝකෝත්තරව හැඩ ගස්වන උතුම් නැමදුමකි.

අල්ලාහ්තආලාට වැඳුම් පිදුම් කිරීමේ අදහසින් පල්ලියේ රැඳී සිටීම මෙහිදී සිදුකෙරේ. අල්ලාහ්තආලාගේ තෘප්තියත්, ඔහුගේ දයාවත්

සමාවත් බලාපොරොත්තු වන අය මෙයට ඉදිරිපත්වේ. මෙය පිරිසිදු හදවත් තිබූ අය සිදුකල පැරණි ව්‍යායාමයකි. වරෙක උමර් තුමා මුහම්මද්තුමාට කතාකොට මෙසේ පැවසීය, මා ජාහලියා(මුස්ලිම් නොවන) කාලයේ මස්ජිදුල් හරාම් තුල එක් රැයක් ඉ:තිකාෆ් කිරීමට (පල්ලියේ රැඳී සිටීමට) භාර උනෙමි. එවිට මුහම්මද්තුමා ඔබ එසේ කරනු මැනවයි ප්‍රකාශ කළහ. (බුහාරි)

මුහම්මද්තුමා අභාවයට පත්වනතුරු සෑම රමධානයකම අවසන් දින 10 තුල ඉ:තිකාෆ් නම් පල්ලියේ රැඳී සිටීම සිදුකල බවද, එතුමාගේ අභාවයෙන් පසු අයේෂා නම් එතුමාගේ භාර්යාවද එසේ සිදුකල බවද එම අයේෂා තුමිය විසින් ප්‍රකාශ කර ඇත.

වක්තෘ මුහම්මද්තුමා සෑම රමධානයකම අවසන් දින 10 තුල මෙසේ ඉ:තිකාෆ් (පල්ලියේ රැඳිසිටීම) සිදුකල අතර එතුමා වියෝවට පත්වන වර්ෂයේ මෙසේ දින 20 ක් ඉ:තිකාෆ් (පල්ලියේ රැඳී සිටීම) සිදුකල බව බුහාරි (රහ්) තුමා ප්‍රකාශ කර ඇත.

ඉ:තිකාෆ් යන වචනයේ අර්ථය:-

අල්ලාහ්තආලාට සම්පවීමේ අධිෂ්ඨානයෙන් යම්කිසි කාල පරිච්ඡේදයක් පල්ලියෙන් පිටනොවී සිටීම වේ. මෙය දැසෙක් කැමැත්තෙන් ඉටුකරන සුන්නත් වත් පිළිවෙතකි. නමුත් රමධාන්හි අවසන් දින 10 තුල ඉ:තිකාෆ් සිටීම ඉතාම වැදගත්වේ. තවද යම් කෙනෙක් ඉ:තිකාෆ් රැඳී සිටිමියි භාරවූයේ නම් එය අනිවාර්යයෙන් ඉටුකල යුතුය. ඉ:තිකාෆ් සිටීමට වේලාවක් සීමාකොට නැත. නමුත් යමෙක් එම අධිෂ්ඨානයෙන් පල්ලියෙහි ටික වේලාවක් රැඳී සිටියත් එය ඉ:තිකාෆ් ලෙස සැළකේ. නමුත් ඔහු පල්ලියෙන් පිටවුවහොත් ඔහුගේ චේතනාව නැවත ඇතිකර ගත යුතුය

ඉ:තිකාෆ්හි අනිවාර්ය කරුණු 2 ක් තිබේ.
1- පල්ලියේ රැඳී සිටීම
2- අධිෂ්ඨාන කරගැනීම

ඉ:තිකාෆ් රැඳී සිටීමට තිබිය යුතු සුදුසුකම්
1- මුස්ලිම්වරයෙකු වීම

2- වැඩිවියට පත්වී සිටීම
3- මනා සිහි බුද්ධියෙන් සිටීම
4- අනිවාර්යයෙන් නැමේ අවශ්‍යතාවයක් නැතිව පිරිසිදුව සිටීම

ස්ත්‍රීන් තමාගේ ස්වාමිපුරුෂයාගෙන් අනුමතිය ලබා ඉ:තිකාෆ්හි යෙදිය හැකිය.

ඉ:තිකාෆ්හි යෙදීමෙන් යමෙක් අල්ලාහ්තආලා මතක කරමින්ද, ඔහුට ප්‍රශංසා කිරීමේ යෙදෙමින්ද, ඔහුගෙන් සමාව ඉල්ලමින්ද, මුහම්මද්තුමාණන් හට සලවාත් නම් ශාන්තිය උදෑවීමට ප්‍රාර්ථනා කරමින්ද, අල්කුර්ආනය පාරායනා කරමින්ද, තමාගේ කාලය ගතකිරීම වැදගත්වේ. තවද අනවශ්‍ය කරුණුවල නිරත නොවී සිටීමද වැදගත්වේ. මෙසේ රැඳී සිටින යමෙකුට ඔහුගේ අනිවාර්ය අවශ්‍යතා ඉටුකිරීම සඳහා පල්ලියෙන් පිටවීමට අවසර ඇත.

ඉ:තිකාෆ් නිෂ්ඵල වන කරුණු
1- අනිවාර්ය අවශ්‍යතාවයක් නොමැතිව පල්ලියෙන් පිටවියාම
2- ඉස්ලාම් හැර වෙනත් ආගම් වැළඳ ගැනීම
3- මතින් හෝ ක්ලාන්තයකින් තමාගේ සිහිය නැතිවියාම
4- ස්ත්‍රීන්ට මාසික ශුද්ධිය ඇතිවීම
5- ප්‍රසූති සිදුවීම
6- සංසර්ගයේ යෙදීම
7- ධාතු පිටවීම

මෙවැනි කාර්යයක් මගින් ඉ:තිකාෆ් නිෂ්ඵල වේ. මෙවැනි දෙයකින් පසු යමෙක් තව දුරටත් ඉ:තිකාෆ් රැඳී සිටීමට බලාපොරොත්තුවේනම් එයින් තොරවී පිරිසිදු වී නැවත රැඳී සිටිය යුතුය.

සකාතුල් ෆිත්ර් (අවුරුදු දින දන්දීම)

ශුද්ධවූ රමධාන් මාසය අවසානයේ අල්ලාහ්තආලා අල්ලාහ්ගේ වක්තෘවරයාණන් මෙම සකාතුල් ෆිත්ර් ගෙවීම කරන්නට අනිවාර්ය කර ඇත. මෙය අවුරුදු දින සලාතයට පෙර ඉටුකලයුතු දෑනයකි.

සකාතුල් ෆිත්ර් හි නීතිරීති

යම් මුස්ලිම්වරයෙක් තමාට හා තමාගේ යැපෙන පවුලේ අය වෙනුවෙන් හා කිට්ටු නෑදෑයන්, මෙහෙකාරයන් වෙනුවෙන් මෙය ඉටුකල යුතුය. ඉහත සඳහන් අය තමා වෙනුවෙන්ම ඉටුකිරීමට හැකියාවක් ලබාගනී නම් එය වැදගත් වනු ඇත. එනමුදු මෙම අණ පමුණුවා ඇත්තේ ඒ අය මූලික කරගෙන බව සඳහන් කල යුතුයි. යමෙක් පිං පිණිස කුසේ සිටින තමාගේ දරුවා වෙනුවෙන්ද මෙය ඉටුකල හැක. උස්මාන් (රලි) තුමාණෝ මවගේ කුසේ සිටින දරුවා වෙනුවෙන්ද මෙය ඉටු කලහ. අවුරුදු දිනයේදීද එම රැයේදීද තමාට හා තමාගෙන් යැපෙන්නන්ගේ ආහාර ගැනීම සඳහා වූ වියදම් හැරුණුවිට ඉතිරිව ඇති දෙයකින් මෙය ඉටුකල යුතුය.

සකාතුල් ෆිත්ර් අනිවාර්ය කරනු ලැබුවේ ඇයි ?

උපවාසයේ යෙදුනු අවස්ථාවන්හිදී හෝ අයහපත් කාර්යයන්හි යෙදීමෙන් ඇතිවන පව්වලින් ඔහුව පිරිසිදු කිරීමටද, ප්‍රීතිමත් අවුරුදු දිනයේ උපවාසයේ යෙදුනු දුප්පතුන්ට ආහාර සපයා සන්තෝෂ කිරීමටද, මෙය අනිවාර්ය කර ඇත. ඒ සමග උපවාසය රාත්‍රී නැමදුම් හා තවත් වත් පිළිවෙත් නිසිලෙස සම්පූර්ණ කිරීමට කරුණාව දයාව දැක්වූ අල්ලාහ්ට ස්තුතිය පිරිනැමීම සඳහාද මෙය ලබාදී ඇත.

ඉබ්න් අම්මාන් (රලි)තුමාණෝ මෙසේ පැවසූහ. සවිමයේ යෙදී සිටින විටදී යෙදුනු අයහපත් ක්‍රියාවලින් මුදගැනීම සඳහාද, දුගී දුප්පතුන්ගේ එම දවසේ ආහාර අවශ්‍යතාවය සපුරාලීම සඳහාද, මෙම දන්දීම අනිවාර්ය කරන ලදී. (අබුදවුද් ඉබ්න් මාජා දර කුත්නි හාකිම්)

සකාතුල් ෆිත්ර් දනය පිරිනැමිය යුතු ප්‍රමාණය

සකාතුල් ෆිත්ර් "සාඋ" එකක ප්‍රමාණයක් දියයුතු බව නබි සල්තුමාණෝ පැවසූහ. එනම් තිරිඟු, පාන්පිටි, රටඉඳි, වියළි මිදි, අකිත් යනුවෙන් හඳුන්වන කිරි ආහාරවර්ග හෝ තමා ජීවත්වන රටෙහි ප්‍රධාන ආහාර ලෙස උපයෝගී කරගන්නා ආහාර වර්ගවලින් මෙය පිරිනැමිය

යුතුය. කුවෙයිටිහි මෙය ඩිනාර් එකක මුදල් ප්‍රමාණයෙන් හෝ ධාන්‍ය වර්ග නම් කිලෝ ග්‍රා 2.5 ක ප්‍රමාණයේ පිරිනැමිය යුතුය

සකාතුල් ෆිත්ර් ලබාගැනීමට සුදුසුකම් ලද්දෝ

තමාගේම ගමක් නොවුනත් තමා එම අවස්ථාවේදී කිනම් ගමක ජීවත්වනවාද එහි සිටින දුගී දුප්පතුන්ට මෙම දානය ලබා දියයුතුයි. තමා ජීවත්වන ප්‍රදේශයේ එවැනි දුගී දුප්පතුන් නොසිටි විටදී එවැනි අය ජීවත්වන ප්‍රදේශයකට එම සකාතුල් ෆිත්රය රැගෙන ගොස් බෙදා දිය යුතුයි. එසේ බෙදා දිය යුත්තේ දුගී දුප්පතුන්ට පමණක් බව සැළකිය යුතුයි.

සකාතුල් ෆිත්ර් බෙදාදිය යුතු වේලාව

මෙය ලබා දීමට නියම වේලාව අවුරුදු දිනට පෙර දිනයේ ඉර බැස ගියායින් පසු ආරම්භ වේ. නමුත් අවුරුදු දිනයේ සලාතයට පෙර මෙය බෙදාදීම ඉතාම වැදගත්වේ. රමධාන් මාසයේ ආරම්භයේ සිට මෙය බෙදාදිය හැකියැයිද ඉස්ලාමික විද්වතුන් පෙන්වාදෙයි.

නාපිඃ මෙසේ පැවසූහ, ඉබ්න් උමර් (රලි) තුමාණන් දරුවන් වැඩිහිටියන් වන සෑම අය වෙනුවෙන්ම සකාතුල් ෆිත්ර් බෙදුදුන්හ. තමාගේ පුංචි පුතා වෙනුවෙන්ද බෙදුදුන්හ. තවද එය ලබාගැනීමට කැමැත්තක් දැක්වුවන්ට එය ලබා දුන්නේය. අවුරුදු දිනයට දවසක් හෝ දවස් දෙකක් පෙර ඉහත සඳහන් අය වෙනුවෙන් මෙය බෙදාදෙන ලදී. (බුහාරි)

ඉතාම අවශ්‍ය හේතුවකින් මිස මෙය අවුරුදුදා සලාතයෙන් පසුව බෙදාදීමට නොසැළසිය යුතුය. එසේ පසුව බෙදාදීම සකාතුල් ෆිත්ර් සේ නොගැනේ. යම් අත්‍යාවශ්‍ය හේතුවක් මත එසේ පසු කලහොත් එයත් සකාතුල් ෆිත්ර් ලෙස පිළිගැනේ. උදාහරණයක් වශයෙන් අවුරුදු දිනය පිළිබඳ නිවේදනය යමෙකු හට කල් ගොස් ලැබුනු විටදී හෝ එම දානය ලබාගන්නට සුදුස්සන් වාසය නොකරන ඈත දුර ප්‍රදේශයක යමෙක් ජීවත්වේනම් මෙවැනි අයගේ සකාතුල් ෆිත්රය අවුරුදු දිනයේ

සලාතයෙන් පසුව බෙදදෙනවිටදීද එය පිළිගැනේ.

වක්තෘ මුහම්මද්තුමා මෙසේ පැවසූහ. යමෙක් එය (සකාතුල් ඕත්ර) සලාතයට පෙර බෙදදෙයිද එය පිළිගන්නා ලද දානයක් (සදකා) සේ ගැනේ. යමෙක් සලාතයෙන් පසු බෙදදෙයිද එවිට එය සාධාරණ දන්දීමක් වශයෙන් පිළිගැනේ. (අබුදවුද්- නසඊ - ඉබ්න් මාජා)

යමෙකුගේ සකාතුල් ඕත්රය සම්පූර්ණයෙන් දුගී දුප්පතුන් ගණනාවකට බෙදදිය හැක. එසේ යම් පිරිසකගේ සකාතය යම් දුගියෙකුට පමණක් බෙදදීමටද හැක. බාල ප්‍රමිතියෙන් අයුතු ආහාර මෙසේ දන්දීමෙන් වැළකී සිටිය යුතුයි. මෙම කරුණා සදහා අල්කුර්ආනය අනතුරු අගවා තිබෙන බව මෙහි සඳහන් කල යුතුය

රමධාන්හි ජයග්‍රහණයන්

ඉස්ලාමික ඉතිහාසය තුලින් බැලුවිට මෙම රමධාන් මාසයේ ඉස්ලාමය ජයගැනීම සඳහා වූ ඉතා වැදගත් නොයෙක් යුද්ධයන් සිදුවී තිබීම පුදුම සහගත කරුණකි ඉස්ලාමය මෙම පොළොවේ ස්ථිරව ව්‍යාප්ත වෙන්නට වූ ප්‍රථම යුද්ධය මෙම රමධාන් මාසයේ 17 වැනි රැයේ සිදුවීම එක්තරා ඉතිහාසගත සන්ධිස්ථානයක් වේ. එම ප්‍රථම ජය බද්ර් යන ස්ථානයෙන්

අත්කර ගනු ලැබේ. එදා දේව වක්තෘවරයාණන් වන මුහම්මද් තුමාණන් මෙසේ ප්‍රාර්ථනා කළහ "දෙවියනි මෙම ජනකොටස විනාශවී ගියහොත් ඔබ මෙම පොළොවෙහි නැමදුමට ලක්නොවේ.

මක්කම ජයගැනීම අරාබි අර්ධද්වීපයේ ජයට පළමු පියවර විය. මෙය මුළු ලොවෙහිම ඉස්ලාමය ව්‍යාප්ත වන්නට ප්‍රථම අදියර විය. මෙම ජයග්‍රහණයද මෙම රමධාන් මාසයේ සිදුවිය. මෙම අදහස අල්කුර්ආනයේ වාක්‍යයන් තුලින් මිනිසුන් රැළි රැළිව ඉස්ලාමයට පිවිසෙති යනුවෙන් මක්කම ජයග්‍රහණය ගැන අන්නස්ර් නම් පරිච්ඡේදයේ සඳහන් කරයි.

යුරෝපය මත සටන් දියත්කිරීම ඉස්ලාමික ඉතිහාසයේ සිදුවූ මහත් සිද්ධියක් වීම වගේම යුරෝපයට නව ප්‍රවණතාවක් ලබා දුන්නේද

මෙම සිදුවීමයි. මෙයද රමධාන් මාසයේ සිදුවීමක් බව මතක් කල යුතුය.

මොංගෝලීන්ගේ යුද වැදුම ඉස්ලාම් සමාජයට ඇතිවූ භයානකම නාස්තියක් විය. අයිනුජාලූස් නම් ස්ථානයෙහි මොංගෝලීය ජාතිකයින්ව මුස්ලිම්වරුන් ජයග්‍රහණය කිරීම ඉතා වැදගත් ඉතිහාසගත සිදුවීමක් බවට සඳහන්වේ. මෙම ජයග්‍රහණයද රමධාන් මාසයේදී සිදුවිය. මෙසේ ඉස්ලාමික ඉතිහාසය දෙස නවීන මිනිසා හැරී බලන කල එහි සන්ධිස්ථානයන් වැදගත් සිදුවීම් දෙවියන්ගේ ආශිර්වාදයෙන් මෙම මාසයේ සිදුවී තිබීම ඔහුව මදක් සිතීමට පොළඹවයි. මිනිසා පිරිසිදු කර කුර්ආනයේ මග පෙන්වීම ලොවෙහි පිබිදෙන්නට එල ලබාදෙන්නට සටන් වැදුනු මාසය මෙයයි යනුවෙන් ඉස්ලාමික ඉතිහාසය ඔහුට මතක්කරදෙයි. ශරීර ආශාවන් එම ශරීර කුසගින්නෙන් මෙල්ලකිරීම තුලින් මැඩ පවත්වා අධ්‍යාත්මික ආලෝකය දල්වන්නට නොයෙක් වැදුම් පිදුම් මෙම මාසයේ කර අල්ලාහ්තආලාට ඉතා සමීපවුවෙක් සේ තමා හැඩ ගස්සාගන්නා මිනිසා ඉස්ලාමයට විරුද්ධ ශක්තීන් එක්රැස්ව සිටින මෙම කාල පරිච්චේදයේ ඉස්ලාමික පිබිදීම් රැළි පාවියන මෙම වකවානුවෙහි ඉතිහාසයේ ඉහත සඳහන් සිද්ධීන් දෙස බලා නව උද්යෝගයක් නැම්මක් ලබාගනී. රමධානයේ බද්ර් සටන මක්කම ජයග්‍රහණය ස්පාඤ්ඤ හමුදු ආක්‍රමණය තාතර් නම් ජාතීන් කෙරෙහි වූ ජයග්‍රහණය ඔහු සිහිකරයි. මෙය කම්මැලි කමේ මාසය නොවේ හම්බ කිරීමට තිබෙන මාසයයි. ඉස්ලාමික ජයග්‍රහණයන් අත්පත්කරදෙන මාසයක් සේ ඔහු සිහිපත් කරයි.

මුස්ලිම්වරයෙකුට වැඩි වැඩියෙන් කුසල් රැස්කර ගතහැකි මෙම රමධාන් මාසයේ ඉහත සඳහන් කරන ලද විශේෂ ක්‍රියාවල යෙදීමෙන් එම මාසයේ එක තත්පරයක්වත් නිකරුනේ ගතවන්නට ඉඩ නොතබා කටයුතු කිරීමට සැමට හැකිවේවා. එසේම ගතවන වර්ෂයක් වර්ෂයක් පාසා හරියාකාරව මෙම කාර්යය ඉටුකර අල්ලාහ්තආලා විසින් දීමට පොරොන්දුවී සිටින ස්වර්ග සැප සම්පත් සියල්ල සියළුදෙනාට ලබා ගැනීමට සර්ව බලධාරී අල්ලාහ්ගේ ආශිර්වාද ලැබිවායි ප්‍රාර්ථනා කරමු.

අල්ලාහ්ගේ උපකාරයෙන් නිමි.

بعض مراكز الإسلامية

ඉස්ලාමය පිළිබඳව අධ්‍යයනය කිරීමට පහසුවෙන් ඇති විවිධ මධ්‍යස්ථාන

ශ්‍රීලංකාවේදී

1- ඉස්ලාමීය අධ්‍යයන කේන්ද්‍රය
15 A රෝහිණී පාර - වැල්ල වත්ත - කොළඹ-06
දුරකථනය : 94-1- 586660

2- ශ්‍රීලංකා ජමාඅත් ඉස්ලාමි
204/1 : වප්පිරඳුන මාවත - කොළඹ - 09
දුරකථනය : 94-1-92760

කුවෙයිට්හිදී

Islam Presentation Committee
P.O. Box: 1613, Safat: 13017, Kuwait.
Tel. 2447526,2444117

ඩුබායිහිදී

Isamic Information Center
P.O.Box: 5732, Dubai U.A.E.
Tel: 525988

සෞදිඅරාබියේදී

Foreigner's Guidance Center,
P.O.Box: 142, Gazime Zone, Saudi Arabia.
Tel: 3248980

බහරේන්වලදී

DISCOVER ISLAM,
Baraka Building, Old Palace Road, Manama,
Baharain.
Tel: 537373, Fax: 533244.

نفحات من رمضان

باللغة السنهالية

تأليف

الشيخ / ساجاهان عبد القادر

محتويات الكتاب

إهداء

لجنة التعريف بالإسلام فى سطور

مقدمة

من المؤلف

١. معنى الصوم

٢. فضائل صوم رمضان

٣. فوائد صوم رمضان

٤. أحاديث الرسول ﷺ عن الصيام

٥. أحكام الصيام

٦. آداب الصيام

٧. مبطلات الصيام

٨. مباحات الصيام

٩. الصيام والصحة

١٠. عبادات في رمضان

١١. قيام الليل

١٢. الاعتكاف

١٣. زكاة الفطر

١٤. فتوحات في رمضان

පිළිගැන්වීම...

නිමකල නොහැකි සෙනෙහසින්
දහසක් දුක්විඳ
මා හදවඩා ගත්
ආදරණීය දෙමාපියන්ටත්,
සමාජය හමුවේ
උගතෙක් යන
විරුදවලිය ලැබීමට
අධ්‍යාපනය නැමති ආභරණය
මට පැළඳවීම සඳහා
නන් අයුරින් උදව් උපකාර කල
නලිමි හජ්පියාර් මැතිනුමාටත්,
මම නිසි මග යවමින්
නියමාකාරයෙන්
ඒ අධ්‍යාපන කටයුතුවල
නිරතකල
දයාබර ගුරුභවතුන්ටත්,
මෙය ගෞරවාදරයෙන්
පිළිගැන්වේ.

- ඒ.සි.සාජහාන්



ඉස්ලාම් හඳුන්වාදීමේ කමිටුව (IPC) ගැන බිඳක්

කුවේට් මුස්ලිම් රටක්. එහි සංස්කෘතින් ශිෂ්ඨාචාරයන්, චාරිත්‍ර වාරිත්‍ර ආදින් සෑම එකක්ම ඉස්ලාම් ධර්මය මුල් කර ගෙන පැවැත්වේ. කුවේට්හි ලක්ෂ ගණනින් විදේශිකයින් සේවය කරන නිසා එම විදේශිකයින් මෙම රටවැසියන් හා ඔවුන්ගේ ධර්මය සංස්කෘතිය ශිෂ්ඨාචාරය චාරිත්‍ර වාරිත්‍ර ආදින් තේරුම් ගැනීමෙන් පමණයි මෙම රටතුල සාමුහිකව ප්‍රශ්ණවලින් තොරව ජීවත්වීම පහසුවිය හැක්කේ.

අල්කුර්ආනය මෙසේ පවසයි : " මනුෂ්‍යයෙනි ඇත්තෙන්ම අපි ඔබ මිනිසෙකුගෙන් හා ස්ත්‍රියෙකුගෙන් නිර්මානය කළෙමු. ඔබ එකිනෙකා දැන ගනු පිණිස අපි ඔබ ජාතීන් හා ගෝත්‍රිකයන් කළෙමු. ඇත්තෙන්ම අල්ලාහ් ඉදිරිපිට ඔබගෙන් ඉතා ගෞරවය ඇති තැනැත්තා ඔබගෙන් බිය බැතියාය. අල්ලාහ් සර්ව්ඥය සර්ව්ඥනය." (අල්හුජ්රාත්:13)

විවිධ ජාතින්, විවිධ සංස්කෘතින් ශිෂ්ඨාචාරයන් අතර ඇතිවන්නා හඳුනා ගැනීම්, ඒවා අතරේ ඇතිවන්නා ගැටුම් ඇතිවීම් මැඩ පවත්වයි. එකිනෙක්කෙනා ගරු කර ජීවත්විය හැකි වතාවරනයක් ඇතිකරයි. විවිධ හේතූන් නිසා හෝ හේතුවක් නොමැතිවද උග්‍ර ගැටුම් හෝ ප්‍රශ්න ඇතිවන මෙවැන් නවීන ලෝකයේ මෙවැන් හඳුනා ගැනීම් ඉතා අවශ්‍යවේ. මෙම නිසා කුවේට් රට වැසියන්ගේ ධර්මය සංස්කෘතිය ශිෂ්ඨාචාරය කලාව රටේ නිති රීති විනයන් ආදින් ගැන හඳුන්වාදීමේ කාර්යය පොත් පිංවයන්, පත්‍රිකාවන්, ඕඩියෝ, විඩියෝ පටි මාර්ගයෙන් ලබාදීමට ඉස්ලාම් හඳුන්වාදීමේ කමිටුව සූදනම්ව සිටි. මේ සඳහා පංති, රැස්වීම් ආදියද සංවිධාන කරයි. මේ හැර ඉස්ලාම් ධර්මය ගැන හඳුන්වාදීම පරමාර්ථයක් කරගෙනද මෙම ආයටනය ක්‍රියා කරයි.

තවද, කුවේට් දේශය තුල දැනට රට රටවල්වල අයත් විදේශිකයින් සේවය කරන නිසා මෙම උත්සාහය තුලින් සංස්කෘතික භුවමාරුවක් ලොව පුරා ඇතිකිරීමටද, මෙම ආයටනය උත්සාහ කරයි.

කුවේට් රට වැසියන්ගේ ධර්මය සංස්කෘතිය, ශිෂ්ඨාචාරය, කලාව, රටේ නිති රීති, විනයන් ආදින් ගැන හඳුනා ගැනීමටත්, අදහස් භුවමාරු කර ගැනීමටත් මෙම ආයටනය වෙත පැමින හෝ දුරකථන මාර්ගයෙන් විමසන්න. ඔබත් ඩිනාර් පමනක් නොව විශාල දැනුමක්ද, මෙම රටින් පිටවී යන විට රැගෙන යන්නද, අමතක නොකරන්න.

කතාගෙන්....

මෙලොව ජීවත්වන සෑම මිනිසෙකුටම තමාගේ ජීවිත සැළැස්ම හෙවත් ජීවත්විය යුතු ක්‍රමය පිළිබඳව අතිශ්‍රේෂ්ඨ වූ අල්ලාහ්තආලා විසින් කියාදී ඇත. මෙම ජීවිත සැළැස්ම අඩංගු කර ඇත්තේ අල්කුර්ආනය තුලය. අල්ලාහ් විසින් මෙම ශ්‍රේෂ්ඨ ග්‍රන්ථය මෙලොවට පහළ කරන ලද්දේ රමධාන් මාසයේය. එහි සතුට හුක්ති විඳීමටත් ඒ සඳහා දෙවියන් වහන්සේට ස්තුති කිරීමටත් විශේෂයෙන්ම රමධාන් මාසයේ සවිමයේ යෙදීම සෑම මුස්ලිම්වරයෙකුගේම අනිවාර්ය වගකීමකි.

සවිමයේ වැදගත්කම පිළිබඳවත්, එහි ආගමික හා විද්‍යාත්මක අභ්‍යන්තරය පිළිබඳවත්, එය වඩාත් අර්ථාන්විත වීම සඳහා ඉටුකලයුතු නිවැරදි ක්‍රමය පිළිබඳවත්, කරුණු සංකලනය කර මෙම පොත් පිංච සකස් කර ඇතිබව සතුටින් දන්වමි. පොත්පත් දහස් ගණනක සවිමය පිළිබඳ කරුණු දක්වා ඇත. ඒ අතරින් ඉතා වැදගත් වූ කරුණු රාශියක් ඒ පොත්පත් වලින්ද උපුටාගෙන මෙසේ සරළව ඉදිරිපත් කිරීමට හැකිවීම ගැන සතුටුවන අතර අල්ලාහ් දෙවියන් වහන්සේට ස්තුතිවන්ත වෙමි.

මෙම පොත ලිවීමේදී අනගි සහයක් ලබාදුන් දයාබර **සුල්ෆි සොහොයුරාටත්**, පරිඝණක කටයුතුවලින් සහය දුන් **යාසිර්** සොහොයුරාටත්, මෙය දෙවනුව මුද්‍රණය කිරීම සඳහා නන් අයුරින් උපදෙස් දුන් **උස්තාද් මන්සූර් සහ අබ්බාස්, හුසෙයින් සොයුරන්ටත්** අනිකුත් සහෝදරයන්ටත් මගේ අවංක ස්තුතිය පිරිනමන අතර ඔවුන් හට අල්ලාහ් දෙවියන් වහන්සේ විසින් උසස් ස්වර්ගය අත්කරදේවායි ප්‍රාර්ථනා කරමි.

- ඒ. සී. සාජහාන්

පෙරවදන...

දයාවන්තවූ අල්ලාහ්ගේ දයාවෙන් හා කරුණාවෙන් අල්කුර්ආනයේ ආරම්භක වචනයන් ශුද්ධවූ රමධාන් මාසයේ මුහම්මද් (සල්) තුමාණන් වෙත පහළ කරන ලදී. මිනිස් සිත්වලට සැනසීමත් මිනිස් සමාජයට යහමගත් පෙන්වූ දේව පණිවිඩයේ මෙම ආලෝක ධාරාවන් දේව මගපෙන්වීම යටතේ දේව වක්තෘවරයානන්ට මග පෙන්වීය.

අප සෑම වසරකම ශුද්ධ රමධාන් මාසය ලැබුවිට මුහම්මද් (සල්) තුමාණන්ට එම දේව ග්‍රන්ථය වන අල්කුර්ආනය පහළවූ එම අවස්ථාවන් මතක් කර සිටිමු. දේව පණිවිඩය ලැබූ මුහම්මද් (සල්) තුමාණන් අසත්‍යයට විරුද්ධව ඉස්ලාමයට එරෙහිවූ ශක්තීන්ට විරුද්ධවී කෙසේ සටන් වැදුනාද? ඉස්ලාමීය සමාජය ඇති කිරීමට කෙසේ මහන්සි වුවාද යන සෑම දෙයක්ම මේ අවස්ථාවේදී මුස්ලිම්වරුන්ගේ මතකයට ගෙන්වයි.

එමනිසා මිනිස් සමාජයට යහමග පෙන්වන්නාසේම සත්‍ය හා අසත්‍ය වෙන්කර පෙන්වන ඉරක්සේද අල්කුර්ආනය පහළවූ කරුණාව පිරි රමධාන් මාසයේ මුස්ලිම්වරයෙක් තම ජීවිතය පුනර්නිර්මාණය කර ගනී. දෙවියන් නමදින්නට ලැබෙන උසස් කාලසීමාවක් සේ ඔහු එය දැක ගනී.

රමධාන් මාසය මුස්ලිම්වරුන්ගේ ලෝකෝත්තර හැගීම් දල්වා අල්ලාහ් සමග තිබෙන ඔවුන්ගේ ගිවිසුම අළුත්කර ගැනීමටත් මග පාදා දෙයි. රමධාන් යනු පුහුණු කඳවුරක සිට වසරක් පාසා නව පරම්පරාවක් පුහුණුව ලබා පිටවීමකි.

- කර්තා

සවිමය යනු

සවිමය යන අරාබි පදයේ අර්ථය වැළකී සිටීම යන්නයි. උපවාසයේ යෙදෙන කෙනෙකු අරුණෝදයේ සිට හිරු බසිනතෙක්, ආහාරයන්ගෙන් පානයන්ගෙන් සහ තම අඹුව හෝ සැමියා හෝ සමඟ ලිංගික සංවාසයෙහි යෙදීමෙන්, රමඩාන් මාසය පුරා වැලකී සිටීමෙන්, අල්ලාහ්ට අවනතවීමයි. එම නිසා උපවාසය හැඳින්වීමට සවිම් යන පදය භාවිතා කෙරේ.

රමඩානයේ වැදගත්කම්

සියළුම මාසයන්ට වඩා රමඩාන් මාසය ශ්‍රේෂ්ඨ මාසයක් ලෙස සකසා එම මාසයේ සවිමයේ යෙදීම ඉස්ලාමීය කුළුණු පහ අතර එකක්සේද, විශ්වාසවන්තයින්ගේ අකුශල් තුරන් කරන සමාන නොවන වැඳීමක්සේද, සකස් කල අල්ලාහ්තආලාට සෑම ප්‍රශංසාවක්ම හිමිවේවා. ඔහු රමඩාන් මාසයේ රාත්‍රියේදී විශේෂයෙන් ලෙලතුල් කද්ර් යන විශේෂ රැයේ සිටගනිමින් නැමදුමෙහි යෙදෙන්නැයි තමාගේ දාසයන්ට මග පෙන්වයි. තවද යමෙක් රමඩාන් මාසයේ දේවවිශ්වාසයෙන් කුශල් බලාපොරොත්තුවෙන් සවිමයේ යෙදී රාත්‍රියේ නැමදුම් කරන්නේද, ඔහුගේ පෙර අකුශල් දෙවියන් ක්ෂමා කරන බවටද පොරොන්දුවී ඇත.

නියගයෙන් වේළී පොළොව වැස්ස බලාපොරොත්තුව සිටින ආකාරයට විශ්වාසවන්තයින් සෑම වසරකම රමඩානය බලාපොරොත්තුවෙන් සිටිති. වැස්ස නිසා වේළී පොළොවෙහි බෝග වැවී සරුවට සෑදී ඵල ලබා දෙන්නේ කෙසේද, එසේම රමඩාන් මාසයත් දාසයින්ට සීමාවක් නැති කුශල් හා කරුණාව ලබාදෙයි. එම මාසයේ ආරම්භය කරුණාවෙන්ද, මැද කොටස අකුශල්වලට ක්ෂමාවක්ද, අවසානය නිරයෙන් ගැලවීමසේද, සඳහන්වේ. මෙම මාසයේ අල්ලාහ්ට අවනතවන්නන් හා අල්ලාහ්ට බියවන්නන්ද, තරගයෙන් දේව නැමදුම්වල නිරතවෙයි. මෙයින් ඔවුන්ගේ විශ්වාසය තවත් වැඩිවෙන නිසා අල්ලාහ්ගෙන් වැඩි වැඩියෙන් කුශල් ලබාගනියි. ඔහු නිරයෙන් නිදහස ලබාගනී. ඔහුත් තමාගේ රාත්‍රි කාලය දේව නැමදුමේද, දවල්




කාලය සවිමයේ යෙදීමේද, ගත කරයි. අල්ලාහ් පහසුවෙන් හා අනුමත කළ මාර්ගයෙන් තමන්ට පිරිනමා ඇති අනුග්‍රහයන්වු කැමිබිමි ආදී දන් දීම්වල නිරතවෙති. ඔවුන්ගේ දෙනෙත් අල්ලාහ්ව මතක්කර කඳුළු හලයි. ඔවුන්ගේ සිත් නොනැවතී අල්ලාහ්ව සිහි කරයි. අල්ලාහ් මෙම මාසයේ පරිත්‍යාග කළ අල්කුර්ආනය ඔවුන් පාරායනය කරගෙන සිටිති. දේව විශ්වාසවන්තයින්ට මෙම මාසය වැඩියෙන් ආදයම් උපයාගත හැකි මාසයකි. යහපත් ක්‍රියාවන්වල තරගයෙන් යෙදෙන්නට ලැබු පිටියකි.

මුස්ලිම්වරුන් වාර්ෂිකව රමධාන් මාසයේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටිති. එනම් රමධානය ඔවුන්ගේ අකුශල්, අයහපත් ක්‍රියාවන්, නැති කරන වැදගත් අවස්ථාවකි. පස්වේල සලාතය ජුම්ආවන් (සිකුරාදා සලාතය) දෙකක් අතර කාලය රමධානයට පසුව එන තවත් රමධානයක් ඒ දෙක අතර ඇතිවු අකුසල්වලට පරිහාරවේ, යනුවෙන් මුහම්මද් (සල්) තුමාණෝ පැවසුහ. එමනිසා යම් මුස්ලිම්වරයෙක් ඔහු තමාගේ කාල වේලාවන් ප්‍රයෝජනයක් නැතිව ගත නොකර දේව නැමදුමෙහිද, අල්කුර්ආනය පාරායන කර එය පාඩම් කිරීමෙහිද, එයට සවන්දීමෙහිද, නිරතවිය යුතුය. අඩුතරමේ රමධානයේ එක්වතාවක් හෝ අල්කුර්ආනය සම්පූර්ණයෙන් කියවා නිම කිරීමට උත්සාහ කල යුතුය. තවද උත්සාහයෙන් යහපත් ක්‍රියාවල්වල යෙදී-මෙන්ද, අල්ලාහ් අනුමත නොකළ දේ නොකිරීමෙන්ද, සිට රමධාන් මාසය යහපත්ව ගත කිරීම මුස්ලිම්වරයෙකුගේ යුතුකම වේ.



රමධානය ප්‍රීති උළෙලක් (උත්සවයක්)

රමධානය අල්කුර්ආනයේ දෘෂ්ටි කෝණයෙන් බලනවිට අල්කුර්ආනය පහළවු ප්‍රීතිය උත්සවාකාරයෙන් භුක්ති විඳින මාසයකි. එමනිසා මෙම මාසයේ සවිමයේ යෙදෙනසේ එය අණ කරයි. "රමළාන් මස මිනිසුනට යහමග පෙන්වන්නාවූද, සත්‍යයෙන් අසත්‍ය වෙන්කර යහමග පැහැදිලි කරන්නාවූද, අල්කුර්ආන් පහළ කරන ලද්දේ එහිදීය. තොපගෙන් කවරෙක් හෝ ඒ මසෙහි නම් ඔහු එහිදී උපවාසයෙහි යෙදිය යුතුය. යමෙක් රෝගාතුරව හෝ ගමනෙහි හෝ වීනම් වෙනදින ගනනක් තොප ගනන සම්පූර්ණ කිරීම පිණිසද, තොපට යහමග පෙන්වූ හෙයින්

More others


















للمساهمة في مشروع طباعة الكتب :



لجنة التعريف بالإسلام

Islam Presentation Committee

لجنة التعريف بالإسلام - شارع فهد السالم - مسجد الملا صالح - تلفون - ٢٤٤٤١١٧ فاكس : ٢٤٠٠٠٥٧

P.O.Box:1613 Safat 13017 - Tel.: 2444117 - Ext. 151 - Fax: 2400057

www.ipc-kw.com ipc@ipc-kw.com

فرع الروضة نساء : ٢٥١١٣٠٥ فرع الجهراء ٤٥٥٨٨٣٠/٤٠ فرع الأحمدي : ٣٩٢١٥٢٧

Al- Rawda Branch (Women) : 2511305 Jahra Branch: 4558830/40 Ahmadi Branch: 3921527